# මොනරාගල ප්‍රාදේශීය සභාව
# 2021.07.16 දින මහ සභා වාර්තාව

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිළ කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ හතලිස් වන (40) සභා වාරය 2021.07.16 වන දින ප.ව 02.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී.චාමර නානායක්කාර මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයශීලන් මැතිතුමා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුල කුමාරසිරි මැතිතුමා (ප්‍රතිපක්ෂ නායක) |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණි මැතිතුමිය |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| 19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |
| | | |
| සභා ලේකම් | - | ඩී.එම්.අනුර දිසානායක මහතා |

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. තව ද කොරෝනා වෛරසය ව්‍යාප්ත වීමත්, සංචරණ සීමා පැනවීම වැනි කාරණා මත අද දිනට මෙම මස සභා රැස්වීම යොදා ගැනීමට සිදු වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 01. පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදි.

ඉන් අනතුරුව සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූයෙන්,සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන්ගේ සහ ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් පසුගිය මස මහ සභා වාර්තාව සභා සම්මත කරන ලදි.

## 02. <u>සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

නැත

## 03.<u>සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම</u>.

**ඉදිරිපත් වී නොමැත**

## 04. <u>යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම</u>

**නැත**

## 05. <u>යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම</u>

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බවත්, එසේ ම න්‍යාය පත්‍රයේ 2021.06.18 ලෙස අතපසුවීමකින් සටහන් වී ඇති දිනය 2021.07.16 ලෙස නිවැරදි විය යුතු බවත් ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

## 5.1. <u>ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**යෝජනා අංක 01**

මොනරාගල ප්‍රාදේශිය සභාව විසින් 2022 වර්ෂය සඳහා අය කරනු ලබන වරිපනම් බදු, වෙළඳ බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු, කර්මාන්ත බදු ආදිය බදු ගාස්තු පනවා අය කර ගැනීමට අවශ්‍ය ගැසට් නිවේදනය සකස් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

2022 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් අය කිරීමට යෝජිත අදාළ සියළුම බදු හා ගාස්තු පනවා අය කර ගැනීමට අවශ්‍ය ගැසට් නිවේදනය සකස් කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 02**

මොනරාගල ප්‍රාදේශීය සභාව මගින් පවත්වා ගෙන යනු ලබන ජල සම්බන්ධතාවය මගින් ජලය ලබා ගන්නා පාරිභෝගිකයින්ගෙන් ජල ගාස්තු අය කිරිම මෙතෙක් සභා තීරණය මත සිදු කෙරුණු අතර, නමුත් වාර්ෂික ගැසට් නිවේදනයට ජල ගාස්තු සම්බන්ධ තොරතුරු ඇතුළත් කිරිමේදී අදාළ ගාස්තු පනවා අය කිරිම සඳහා අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරිම හෝ වැලඳ ගැනීම සිදු කළ යුතු බැවින්, මෙම කාර්ය විධිමත් කිරිම සඳහා ජල මීටර් සවි කිරිම සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙහිදී සභාවට අයත් ජල මූලාශ්‍රයේ ජලය මේ වන විට ක්ලෝරීන්කරණය කරන අතර මෙහි සොයාබැලීම් කටයුතු සඳහාද සේවකයෙකු යොදවා ඇති බවත්,ඉදිරියේදී මෙහි පිල්ටරයක් සවිකිරීමටද ප්‍රතිපාදන වෙන්වන බවත් , මෙම ජල මූලාශ්‍රයෙන් ජලය ලබා දෙන ඒකක වලින් 2022 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට අදාලව පවතින තත්ත්වය ගැසට් පත්‍රයේ පල කර ප්‍රසිද්ධ කිරීමත් එය විධිමත් කිරීම සඳහා ජල මීටර් සවි කළ යුතු බවත් මේ සම්බන්ධයෙන් විගණනයෙන්ද පෙන්වා දී ඇති බවත් ගරු සභාපතිතුමන් සඳහන් කර සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

එහිදී නීත්‍යානුකූලභාවය තහවුරු කර ගැනීම සඳහා එකවර මීටර් සියල්ල සවි නොකර අධියරයෙන් අධියර කොටස් වශයෙන් මීටර් සවිකිරීම සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

විගණන විමර්ෂණ වලින්ද මෙම තත්ත්වය පෙන්වා දී ඇති නිසා ප්‍රාදේශීය සභා ජල මූලාශ්‍රයෙන් ජලය ලබා දෙන ඒකක සඳහා ජල මීටර් සවි කිරීම සිදුකර අය කළ යුතු ගාස්තු පිළිබඳව වෙනම තීරණය කර ප්‍රසිද්ධ කර අය කිරීම සුදුසු බවත් එම කටයුතු වර්ෂය අවසන් වීමට පෙර ක්‍රියාත්මක කිරීම අපහසු වන්නේනම් දැනට අය කරන ගාස්තු හෝ ගැසට් පත්‍රයේ පල කර ප්‍රසිද්ධ කිරීම සුදුසු බවත් තවද ජල මීටර් සවිකිරීමේදී වෙළඳ ව්‍යාපාර, වාහන හා සේවා ස්ථාන මෙන්ම අඩු ආදායම්ලාභී නොවන නිවාස සඳහා පළමුව මීටර් සවි කර ගාස්තු අය කිරීමටත් අඩු ආදායම්ලාභී පවුල් සඳහා දෙවන අදියරයේදී මීටර් සවිකිරීම සුදුසු බවටත් සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

**යෝජනා අංක 03**

2010/2011 වර්ෂවලදී කරන ලද වරිපනම් තක්සේරුවට යටත්ව මොනරාගල ප්‍රාදේශීය සභාව මෙතෙක් වරිපනම් බදු අය කරන අතර, මහ සභාවේ තීරණය මත මේ සඳහා නව තක්සේරුවක් මෙතෙක් ඉල්ලුම් කර නොමැති බැවින්, වරිපනම් බදු අය කරන ප්‍රදේශය තවමත් පුළුල් කිරීමට කටයුතු නොකර ඇති අතර, මේ වන විට දියුණු මට්ටමක පවතින හුලංදාව දකුණ 'දොඩම්වත්ත' යන ප්‍රදේශයේ ගම්වාසින් විසින් වරිපනම් සීමාවේ ජීවත් වන බවට වාර්තා ලබා ගැනීමට ද ආයතනයට පැමිණෙන බැවින්, මෙම ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරිම සඳහා මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. මෙම යෝජනාවේ හුලංදාව දකුණ යන්න හුලංදාව වසමේ 'දොඩම්වත්ත' ලෙසට නිවරදි විය යුතු බවත් ඒ අනුව ඉහත යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදි.

මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අය කරන කලාපය වසර ගණනාවක සිට ව්‍යාප්ත කිරීමක් සිදු කර නොමැති වීම සම්බන්ධව විගණනය විසින් සහ විවිධ ආධාර ලබා දෙන අංශ මගින් පෙන්වා දී ඇති අතර බල ප්‍රදේශය පුරා මුල් කාලයට වඩා දියුණු කළ ප්‍රදේශ දක්නට ඇතත් ජනතාවගේ දුෂ්කර ජීවන තත්ත්වය හේතු කොට ගෙන මෙය අපහසු කාර්යයක් බව ගරු සභාපතිතුමන් සඳහන් කර සිටි අතර හුලංදාව ග්‍රාම නිලධාරී වසමේ දොඩම්වත්ත කොටසේ පදිංචි බොහෝ පිරිසක් ඔවුන්ගෙන් වරිපනම් බදු අය කිරීමට කටයුතු කර දෙන ලෙස බොහෝ අවස්ථාවල ඉල්ලීම් කර ඇති බැවින් සහ මේ වන විට එම ප්‍රදේශය සාපේක්ෂව  දියුණු මට්ටමක පවතින ප්‍රදේශයක් වශයෙන් හඳුනාගත හැකි බවටත් ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව  සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

හුලංදාව වසමේ දොඩම්වත්ත ප්‍රදේශය දියුණු මට්ටමක පවතින ප්‍රදේශයක් වශයෙන් සහ එම ජනතාවගේ ඉල්ලීම්ද පවතින බැවින් මුප්පනේ වසම ආවරණය වන පරිදි එනම් ඩිපෝව පාර සිට කුමාරපුර සහ දොඩම්වත්ත,වැටකේආර දක්වා වූ ප්‍රදේශයම ආවරණය වන ලෙස දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවත්, එම ප්‍රදේශවල ජීවත් වන ජනතාවගෙන් වරිපනම් බදු අය කිරීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

ඒ වගේම දැනට වරිපනම් බදු අය කරන සීමාව තුළ අලුතින් ඉදිකර ඇති එහෙත් තක්සේරු කර නොමැති සියලුම ගොඩනැගිලි සඳහා විධිමත් තක්සේරුවක් කරන තෙක් තාවකාලික තක්සේරුවක් සිදු කර වරිපනම් බදු අය කිරීම සුදුසු බවත් මෙම තාවකාලික තක්සේරුව සිදු කර ගැනීමට පිටස්තර පළාත් පාලන ආයතනයන් වලින් ආදායම් පරීක්ෂකවරුන් කණ්ඩායමක් යොදවා ගනිමින් සිදු කිරීම සුදුසු බවට සභාව තීරණය කරන ලදි.

එහිදී ක්‍රිශාන්ත රත්නායක සහ ප්‍රදීප් විතානගේ යන මන්ත්‍රීවරුන් විසින් සිරිගල ප්‍රදේශයේ වැලියාය දක්වා කොටසද වරිපනම් බදු අය කිරීම සඳහා ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ප්‍රකාශ කර සිටින ලද අතර ඒ අනුව තවත් විවිධ අදහස් ඉදිරිපත් විය.

එහිදී බොහෝ ප්‍රදේශවල දරිද්‍රතාවයෙන් පෙළෙන  පවුල් බහුතර ප්‍රමාණයක් සිටින බැවින් ඉදිරියේදී පූර්ණ සමීක්ෂණයක් සිදු කර මේ සඳහා සුදුසු ප්‍රදේශ තෝරා පත් කර ගැනීමෙන් අනතුරුව ඉදිරි කටයුතු කරමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

**යෝජනා අංක 04**

මොනරාගල, වැලියාය, අංක 161 ලිපිනයෙහි පදිංචි පවුල් 07 ක් පමණ භාවිතා කරන මාර්ගය යතුරු පැදියක් හැර වෙනත් වාහනයකට ගමන් කළ නොහැකි තත්ත්වයට අබලන්ව ඇති  බැවින් එම මාර්ගය සඳහා පැති බැම්මක් ඉදිකොට මාර්ගය පිළිසකර කර දෙන ලෙස 6 දෙනෙකුගේ අත්සනින් යුතු ලේඛනයක් ද සහිතව කර ඇති ඉල්ලීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. මෙම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම මාර්ගයේ තත්ත්වය සම්බන්ධව කාර්මික නිලධාරී මහතා යොදවා පරීක්ෂා කර බලා අදාල වාර්ථාවන් ලබා ගැනීමෙන් අනතුරුව ඇස්තමේන්තු ප්‍රකාරව මෙම යෝජනාවට අදාල පැති බැම්ම ඉදි කිරීම සුදුසු බවත්,මෙම සංවර්ධන කටයුතු විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සිදු කර එම ගෙවීම් කටයුතුද ඉතා නිවැරදිව සහා අරමුල් යටතේ ගෙවීම් කිරීම සුදුසු බවත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

**යෝජනා අංක 05**

මොනරාගල, මොනරකැලේ, සිරිගල වත්ත හි පදිංචි තංගවේල්රාජගෝපාල් යන අය විසින් එදිනෙදා කුළි වැඩ කරමින් නිසි ජීවනෝපාය මාර්ගයක් නොමැතිව ඉතා දුක්බර ජීවිතයක් ගත කරන අතර, දැනට මැටි ගසා පොල් අතු හා ටකරන් සෙවිලි කර ඇති තාවකාලික නිවසක ජීවත් වන අතර, වර්ෂා කාලයේදී එයින් ජලය කාන්දු වීම මත ඉතා අපහසුතාවයට තම පවුලේ අය මුහුණ පාන බැවින්, වහලය සෙවිලි කර ගැනීමට සෙවිලි ෂීට් 20 ක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බැවින්, එය ලබාදීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.
මේ සඳහා නගරයේ ගලවා ඉවත් කිරීමට නියමිත පැරණි වැසිකිළියෙන් ඉවත් කරන හොඳ තත්ත්වයේ පවතින සෙවිලි ෂීට් 20 ක් ලබා දිය හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර ඊට සභාවේ සියලු දෙනාම එකඟතාවය පල කර සිටින ලදි.

**යෝජනා අංක 06**

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයට අදාළව අය වැය සකස් කිරිමේ මූලික කටයුතු සැලසුම් කරමින් පවතින අතර, ඒ සඳහා රටේ පවතින තත්ත්වයත් සමග ප්‍රායෝගිකව ඉටු කළ හැකි ජනතාව වෙනුවෙන් බලපාන අත්‍යාවශ්‍ය සංවර්ධන යෝජනා ඇතුළත් කළ යුතු බැවින්, ප්‍රාදේශීය සභා පනතේ විධි විධානයන්ට යටත්ව සෞඛ්‍ය සේවා, භෞතික සැලසුම්, මං මාවත්, ජල සේවා , පොදු මහජන උපයෝගිතා සේවා, සුභ සාධක සේවා යන විෂයන්ට අදාළව 2021.08.31 දින වන විට යෝජනා ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

2021 වර්ෂයට අදාළ වැය ලේඛනයේ 90%ක් පමණ සංවර්ධන යෝජනා මේ වන විට කර ගැනීමට හැකි වූ බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටි අතර ඉදිරියේදී ද බොහෝ සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන ලැබීමට නියමිත බවත්, 2022 වර්ෂයේ අය වැය සඳහා ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඉටු කළ හැකි සංවර්ධන යෝජනා නියමිත දිනට ලබා දීමට කටයුතු කරන ලෙසට සඳහන් කර සිටින ලදි. ඒ සඳහා සභාවේ කිසිදු විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනු අතර එය සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 07**

ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ 2021 වැඩසටහන යටතේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් ජල මූලාශ්‍රයේ ප්‍රධාන ජල සැපයුම් ටැංකිය හා ජලය ක්ලෝරින්කරණය කිරීමට පහසුකම් වැඩිදියුණු කර ගැනීම සඳහා රු.611,317.87 ක් සහ ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය වටා ඇවිදින මංතීරුවක් සකස් කිරීම සඳහා රු.2467,405.31 ක්ද වශයෙන් ව්‍යාපෘති දෙක අනුමත කර එවා ඇති අතර මෙම ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවත්,තවද ඕනෑම ව්‍යාපෘතියක් සඳහා අනුමත මුදල ලක්ෂ 20 ඉක්ම වන ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ සිදු කළ යුතු බැවින් ක්‍රීඩාංගනය වටා ඇවිදින මං තීරුවක් සකස් කිරීම යන ව්‍යාපෘතිය ප්‍රසම්පාදන ක්‍රියාවලිය මත සිදු කිරීම සඳහා මහ සභාවේ තීරනය ලබා දීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් විජේරත්න ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

තවද මේ දිනවල පවතින කොරෝනා වසංගතය හේතුවෙන් හා පනවා ඇති සංචරණ සීමා හේතුවෙන් ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය වටා ඇවිදින මංතීරුවක් සකස් කිරීමේ සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව විවෘත ටෙන්ඩර් මගින් කොන්ත්‍රාත් කරුවන් තෝරා ගැනීමේදී පිට පළාත් වලින් කොන්ත්‍රාත් කරුවෙකු තේරී පත් වුවහොත් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ගැටලු රැසකට මුහුණ දීමට සිදුවන බැවින් සහ මෙම ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කළ යුතු බැවින් මිල සැසඳුම් ක්‍රමය යටතේ ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනයේ (ICTAD) ලියාපදිංචි සුදුසුකම් සපුරා ඇති පිළිගත් මොනරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් ලංසු කැඳවා මෙම සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කළ යුතු බවට ගරු සභාපතිතුමා ගරු සභාවට පැහැදිලි කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ 2021 වැඩසටහන යටතේ උක්ත සංවර්ධන යෝජනා දෙක ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්, ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය වටා ඇවිදින මංතීරුවක් සකස් කිරීමේ සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී රටේ පවතින කොරෝනා වසංගතය හේතුකොට ගෙන විවෘත ටෙන්ඩර් මගින් කොන්ත්‍රාත් කරුවන් තෝරා ගැනීම ගැටලු සහගත බැවින් මිල සැසඳුම් ක්‍රමය යටතේ ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනයේ (ICTAD) ලියාපදිංචි සුදුසුකම් සපුරා ඇති පිළිගත් මොනරාගල ප්‍රා දේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් ලංසු කැඳවා මෙම සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්, මෙම සංවර්ධන යෝජනා ලක්ෂ 20ට වැඩි යෝජනා සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා ගෙන විධිමත් ක්‍රම වේදයන්ට යටත්ව කඩිනමින් සිදු කිරීමට පියවර ගැනීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමැතිය හා තීරණය ලබා දෙන ලදි.

## 5.2 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සුනිල් අරංගල මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

මොනරාගල, හොරොම්බුව ග්‍රාමසේවා වසමේ පොල්ගස්යාය යන ලිපිනයේ පදිංචි පවුල් 07ක පමණ ප්‍රමාණයක් පානීය ජලය ලබා ගනු ලබන්නේ භූගත ලිං වලින් වන අතර සෑම වර්ෂයකම පවතින දැඩි නියඟය සහිත කාල වලදී එම ලිං සිඳීයාම හේතුවෙන් ඉතා අපහසුතාවයට පත්වන බැවින් ප්‍රධාන මාර්ගයේ ජල සැපයුමෙන් මීටර් 500 ක් පමණ දුරකට මෙම පවුල් කිහිපය සඳහා ජලය ලබා දෙන ලෙස ප්‍රදේශවාසීන් විසින් කර ඇති ඉල්ලීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට තරංග දිසානායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම පවුල් කිහිපය සඳහා මීටර් 500ක් දුරට ජලය ලබා දීම සම්බන්ධයෙන් ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කර අවශ්‍ය කටයුතු සිදු කර දීමත්, ඒ සඳහා කාණු පද්ධතිය කපා අවශ්‍ය ජල නළ එලීම සභාව මගින් සිදු කරදීමත් එය කාර්මික නිලධාරී මහතාගේ අධීක්ෂණය යටතේ සිදු කිරීම සුදුසු බවටත් විරෝධතාවයකින් තොරව සභාවේ ඒකමතික එකඟතාවය පල කර සිටින ලදි.

- **හදිසි යෝජනා ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර තීරණයන් ගත යුතු කාරනා කිහිපයක් සම්බන්ධයෙන් සහ අද දිනම සභා තීරණ ගත යුතු හදිසි යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවට ගරු සභාපතිතුමා මහ සභාව වෙත ප්‍රකාශ කර ඒ සඳහා සභාවේ එකඟතාවය විමසා සිටින ලදි. ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම කාරණාවන් සහ යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදි.

1) ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ කාර්ය සාධන වාරිකය යටතේ කොවිඩ් 19 සඳහා ප්‍රතිචාර දැක්වීම වෙනුවෙන් පළාත් පාලන ආයතනය තුළ දුරකථන සේවා කවුළුවක් ආරම්භ කර පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ සියළුම පළාත් පාලන ආයතන සඳහා එක් ආයතනයකට ට රු.300000/= ක මුදලක් වෙන් කරන ලෙසට පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් කර ඇති දැනුම් දීම මත එම මුදල උපයෝගී කර ගනිමින් දුරකථන සේවා කවුළුවක් ආරම්භ කර පවත්වා ගෙන යා යුතු බවත්, ඉදිරි කාර්ය සාධන මුදල් ලබා දීමේදී මෙම කටයුත්ත ක්‍රියාත්මක කර ඇති ආකාරයේ ප්‍රගතිය සලකා බලන බවත්, අද දින උදය වරුවේ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ පැවති දැනුවත් කිරිමේ වැඩසටහනේදී දැනුම් දී ඇති අතර, අප කාර්යාල පරිශ්‍ර යේ මෙම දුරකථන සේවා කවුළුවක් පවත්වා ගෙන යාම සඳහාත් මේ සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් පත් කරවා ගත යුතු බවත්, මේ සඳහා සුදුසු ස්ථානයක් සහ අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගැනීම සිදු කිරිම සම්බන්ධවත් අද දින සභාවේ සාකච්ඡා කර ලබන මස මහ සභාවේ න්‍යාය පත්‍රයට යෝජනාවක් වශයෙන් මෙය ඇතුළත් කිරිමට පියවර ගන්නා බවත්, ගරු සභාපතිතුමා විසින් මහ සභාවට දැනුම් දෙන ලදී.

මෙම දුරකථන සේවා කවුළුව ආයතනයේ දැනට ගිණිහට අංශය පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ඇතුල්වන ස්ථානයේ ඇති කාමරය මේ සඳහා යොදා ගනිමින් එහි රථගාල පැත්තෙන් ප්‍රධාන කාර්යාලයට මුහුණලා දොරටුවක් සකස් කර ඒ සඳහා දැනට සිටින ගිනිහට අංශ ප්‍රධානීන්ගේ මූලිකත්වයෙන් සහ අධීක්ෂණය, මෙහෙය වීම යටතේ ගිනිහට අංශයේ අනෙකුත් නිලධාරින් මේ සඳහා යොදවමින්, විධමත් සැලැස්මක් සකස් කර මෙහි කටයුතු පවත්වා ගෙන යාම සුදුසු බවත් මහ සභාවේ සාකච්ඡා කළ අතර, මෙම සේවා කටයුතු දිවා රාත්‍රි දෙකෙහි ම අඛණ්ඩ සේවාවක් ලෙස Roster ක්‍රමය යටතේ යොදවා ගත යුතු අතර, මෙම නිලධාරින්ගේ තනතුරට අදාළ රාජකාරි කටයුතු මෙන් ම හදිසි රාජකාරි කටයුතු ද කොවිඩ් 19 තත්ත්වයට අදාළව පැවරෙන රාජකාරි කටයුතුවලට බාධාවක් නොවන අයුරින් පවත්වා ගෙන යා යුතු අතර, මේ සඳහා විධිමත් සැලැස්මකට අනුව කටයුතු කළ යුතු බවත්, සභාවේ සාකච්ඡා වූ අතර, මෙම ප්‍රතිපාදන යටතේ කාර්මික නිලධාරි මහතාගේ ද සහයෝගය ඇතිව මෙම කටයුතු විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සිදු කර මේ සඳහා අත්‍යාවශ්‍ය උපකරණ ද මෙම ප්‍රතිපාදන යටතේ ම මිලදී ගැනීමට කටයුතු කරමු බවටත් මහ සභාවේ සාකච්ඡා කරන ලදී.

2) මොනරාගල, ප්‍රාදේශිය සභාවට අයත් UP ZA 5061 අංක දරණ බැකෝලෝඩර් යන්ත්‍රයේ හදිසි අළුත්වැඩියා කටයුත්තක් වෙනුවෙන් රු.432,585.48 ක මුදලක් ගෙවීම සඳහා අදාළ නියෝජිත ආයතනය විසින් ඇස්තමේන්තු එවා ඇති බැවින් මෙම මුදල් සභා අරමුදලින් ගෙවීම් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

බැකෝ ලෝඩර් යන්ත්‍රයේ සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා මෙම අලුත්වැඩියා කටයුතු ඉතා කඩිනමින් සිදු කර ගත යුතු බවත් මෙම කටයුතු සිදු කරන්නේ සහ ඇස්තමේන්තු ලබා දෙනු ලබන්නේ අදාළ නියෝජිත ආයතනයෙන්ම වන බැවින් මෙහි කිසිම ගැටලුකාරී තත්ත්වයක් නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම යන්ත්‍රයේ අදාළ අලුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කර ගැනීම සුදුසු බවත් එය විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සිදු කර මෙම ගෙවීම් කටයුතු සභා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

3) ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත සඳහන් මාර්ග කොන්ක්‍රීට් කිරීම සඳහා රු.මිලියන 48 ක ප්‍රතිපාදන වෙන් කර ඇති බැවින්, එම පහත සඳහන් මාර්ග කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් විජේරත්න ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාවට අදාළ ව්‍යාපෘතිවල සංවර්ධන කටයුතු 2021.10.15 දින වන විට සියළු වැඩ අවසන් කර අදාළ බිල්පත් අමාත්‍යාංශය වෙත යොමු කර තිබිය යුතු බැවින්, එහි කටයුතුවලට අදාළව කාලය කළමනාකරණය කර ගත යුතු බැවින් මෙම සභා වාරයේ හදිසි යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කර සභා තීරණය ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන මුදල රු. |
|---|---|---|---|
| 1 | විහාරමුල්ල | වෙලේවත්ත කුඹුර හරහා මොණරාගල නගරය දක්වා මාර්ගය | 2,000,000.00 |
| 2 | වැලියාය | වැලියාය චමින්ද මහතාගේ නිවසට යන මාර්ගය | 1,000,000.00 |
| 3 | වැලියාය | සිරිගල පහල කොටස ලයිම පාර | 1,000,000.00 |
| 4 | මොණරාගල | පොතුවිල් පාර ගරු මහ ඇමති ශශීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමාගේ නිවස ඉදිරිපිට මාර්ගය | 1,000,000.00 |
| 5 | මොණරාගල | මොණරාගල පැරණි පොළ මාර්ගයේ සිට පින්නගොල්ල දක්වා මාර්ගය | 1,000,000.00 |
| 6 | කහම්බාන | කළුගම්මුල්ල හන්දියේ සිට කිරිමැටිආර දක්වා මාර්ගය | 1,000,000.00 |
| 7 | කහම්බාන | කහම්බාන හන්දියේ සිට රදාන මාර්ගය | 1,000,000.00 |
| 8 | මාරාව | කණුකැටියවත්ත මාර්ගය | 1,000,000.00 |
| 9 | මාරාව | ඉහාව ගග පාර | 1,000,000.00 |
| 10 | තෙනගල්ලන්ද | අටේ ඉඩම මාර්ගය | 1,000,000.00 |
| 11 | තෙනගල්ලන්ද | ඉත්තෑකටුව තෙලබෝගල මාර්ගය | 1,000,000.00 |
| 12 | හොරොම්බුව | පොල්ගස්යාය වෙල්ලච්චි කඩේ පහල කොටස ලයිම මාර්ගය | 1,000,000.00 |
| 13 | හොරොම්බුව | ගල්වල පාර පස්සර මහතාගේ නිවස අසල සිට අතුරු මාර්ගය | 1,000,000.00 |

| | | | |
|---|---|---|---|
| 14 | කොලොන්වින්න | මහගංගොඩ සුසාන භූමිය පාර (සිසිර මයාගේ කඩය අසල) | 1,000,000.00 |
| 15 | කොලොන්වින්න | මහවෙල ගනේ උල්පත පන්සල පාර | 1,000,000.00 |
| 16 | වෙහෙරගල | සමෘද්ධි නිවාස පාර (හැවන) | 1,000,000.00 |
| 17 | වෙහෙරගල | හැවන අමුණ පාර | 1,000,000.00 |
| 18 | බෝහිටිය | අම්පිටිය ඌරාගොඩ පාර (ඉරේෂා මියගේ නිවස අසල) | 1,000,000.00 |
| 19 | බෝහිටිය | බෝහිටිය අඹගස්හන්දිය අසල ඉහල පාර | 1,000,000.00 |
| 20 | කවුඩාව | වැදිකුඹුර කපිල මයාගේ නිවස ඉදිරිපිට පාර(විද්‍යාලෝක ම.වි. අසල) | 1,000,000.00 |
| 21 | කවුඩාව | වැදිකුඹුර අප්පුසිංඤෝ මයාගේ නිවස ඉදිරිපිට පාර (විද්‍යාලෝක ම.වි. අසල) | 1,000,000.00 |
| 22 | මාගන්දනමුල්ල | ලයන් කෙටරින් නිවස පාර | 1,000,000.00 |
| 23 | රත්තනපිටිය | සන්නිවේදන කුළුන මාර්ගය - රත්තනපිටිය | 1,000,000.00 |
| 24 | රත්තනපිටිය | රෝහල් වටරවුම දෙවන අතුරු මාර්ගය | 1,000,000.00 |
| 25 | මදුරුකැටිය | සිංහසිරිපුර අවල මාවත | 1,000,000.00 |
| 26 | මදුරුකැටිය | කලවැල්ආරගම VII වන පටුමග අතුරු මාර්ගය | 1,000,000.00 |
| 27 | හිදිකිවුල | කරපිංචාගලයාය මාර්ගය | 1,000,000.00 |
| 28 | හිදිකිවුල | කිරිගම්මාන මාර්ගය | 1,000,000.00 |
| 29 | නක්කල | කනත්ත මාර්ගය | 1,000,000.00 |
| 30 | නක්කල | සමගිපුර මාර්ගය | 1,000,000.00 |
| 31 | ටැංවත්ත | අලකොලමණ්ඩිය මාර්ගය | 2,000,000.00 |
| 32 | මාගන්දනමුල්ල | මාගන්දනමුල්ල බෝඅතුපිටිය මාර්ගය | 1,000,000.00 |
| 33 | බටුගම්මන | ආගරේ මාර්ගය | 2,000,000.00 |
| 34 | ගුරුහෙල | ඩෝසර්වත්ත උඩ කොටස මැදරොද මාර්ගය | 1,000,000.00 |
| 35 | ගුරුහෙල | කොටිගල්හෙල පන්සල අසල මාර්ගය | 1,000,000.00 |
| 36 | හුලංදාව දකුණ | ජයනිල්ගම අතුරු මාර්ගය | 1,000,000.00 |
| 37 | හුලංදාව දකුණ | නිවස අසල අතුරු මාර්ගය | 1,000,000.00 |
| 38 | හුලංදාව වම | ආරාමය අසල අතුරු මාර්ගය | 1,000,000.00 |
| 39 | හුලංදාව වම | කවුඩාව මාර්ගයේ හුලංදාව වම අතුරු මාර්ගය | 1,000,000.00 |
| 40 | අලියාවත්ත | වස්තු මහතාගේ නිවස අසලින් යන මාර්ගය | 1,000,000.00 |
| 41 | අලියාවත්ත | අලියාවත්ත ඉහල කොටස රත්නපාල මහතාගේ නිවස අසල මාර්ගය | 1,000,000.00 |
| 42 | මුප්පනේ | අක්කර 25 මරණාධාර සමිති ශාලාව ඉදිරිපිට මාර්ගය | 1,000,000.00 |
| 43 | මුප්පනේ | දොඩම්වත්ත 4 වන පටුමග මාර්ගය | 1,000,000.00 |
| 44 | හුලංදාව | පට්ටියලන්ද සමිති ශාලාව ඉදිරිපිට මාර්ගය | 1,000,000.00 |
| 45 | හුලංදාව | මෙහෙනි ආරණ්‍ය මාර්ගය | 1,000,000.00 |

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

අදාළ ප්‍රතිපාදන යටතේ මෙම සංවර්ධන ව්‍යාපෘති විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

තව ද කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම සඳහා යන වියදම සලකා බලා දැනට කිලෝ ග්‍රෑම් 01 ක විකුණුම් මිල වන රු.15.00, රු.20.00 දක්වා ඉහළ නැංවීම සඳහා විෂය භාර නිලධාරි විසින් සභා අනුමැතිය ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇති අතර, මෙය සභාවේ සාකච්ඡාවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී. ඒ පිළිබඳව ගරු සභාවේ සාකච්ඡා කරන ලද අතර, මෙම පොහොර මිල රු.20/= දක්වා වැඩි කිරීමට පියවර ගනිමු බවත්, මෙය හදිසි යෝජනාවක් නොවන බැවින්, ලබන මස මහ සභාවේ න්‍යායපත්‍රානුකූලව අනුමැතිය ගනිමු බවට සභාවේ සාකච්ඡාවට බඳුන් විය.

## 06. ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම.

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ එනම් 2021.06.01 දින සිට 2021.06.30 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන ලද අතර, එම යෝජනාව සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කරන ලදී. සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුන බැවින් එම ආදායම් වියදම් වාර්තාව පිළි ගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. කමිටු වාර්තා සලකා බැලීම

නැත

## 08. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරීම බැවින්,වෙනත් කරුණු සමඟම සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

### 8.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අජිත් අගලකඩ මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව පැරණි වෙළඳ සංකීර්ණයේ අංක 13 කඩ කාමරය සමූපකාරය සඳහා භාවිතා කර ඇති බවත්, අප්‍රේල් මාසය වන තෙක් ඒ සඳහා ඔවුන් කුළී මුදල් ගෙවා ඇති අතර, ඉන්පසු සභාව මගින් කුළී අය කර ගැනීම නතර කර ඇති බව සඳහන් කර ඇති අතර, එම කඩ කාමරය ඔවුන් වෙත නැවත ලබා දෙන ලෙස ඉල්ලා සමූපකාරය හරහා සියළුම සභිකවරුන්ට ලිපි එවා ඇති බැවින්, ඒ සම්බන්ධව දැන ගැනීමට අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. එසේ ම කොරෝනා සමය තුළ ජනතාවට සහන මිලට භාණ්ඩ මිලදී ගැනීමේදී සතොස සමූපකාර වැනි වෙළඳ ආයතන මහත් පිටුවහලක් වූ බැවින් නගර ආශ්‍රිතව සමූපකාර සමිතියක් පැවතීම ජනතාවට විශාල සේවාවක් සැපයිය හැකි අතර, තමා සොයා බැලූ කරුණු කාරණාවන් ට අනුව ඌව පළාතේ ලාභ ලබන සමූපකාර සමිතිවලින් එකක් මොනරාගල සමූපකාරය වශයෙන් ද හඳුනා ගෙන ඇති අතර, ඔවුන් සේවාවන් කිරීමට කැමැත්තෙන් සිටින නිසා මෙහි නීත්‍යානුකූල භාවය විසඳා ගෙන ඔවුන් වෙත කඩ කාමරය ලබා දීමට කටයුතු කරමු බවට ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාට ම ස්තුතිය පුද කර සිටින ලදී.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

- නව බස් නැවතුම්පොළ අංක 47 කඩ කාමරය සමූපකාර සමිතිය සඳහා මීට පෙර ලබාදී තිබූ අතර, පසුව ඔවුන් විසින් එම කඩ කාමරය ග්‍රාමීය බැංකුව පවත්වා ගෙන යාම සඳහා ලබාදී ඇති අතර, පසුව ග්‍රාමීය බැංකුව විසින් නැවත එම කඩ කාමරය හයිලන්ඩ් කිරි පිටි වෙළඳසැලක් පවත්වා ගෙන යැම වෙනුවෙන් බදු දී ඇති බැවින්, පොදු වෙළඳපොළ අංක 13 කඩ කාමරය සමූපකාර සමිතිය සඳහා නැවත ලබාදී තිබූ අතර, පසුව පොදු වෙළඳපොළ කඩ කාමර කඩා ඉවත් කිරීමේදී ඒ වෙනුවෙන් ඉදිකරන ලද ටකරන් කඩයක් නැවත සමූපකාරය වෙත ලබාදුන් අතර, මේ වන විට ඔවුන් එය වසා දමා ඇත. ඉන්පසු නව වෙළඳ සංකීර්ණයේ අළුතින් ඉදිකරන ලද අංක 13 කඩ කාමරය මේ ආකාරයෙන් නැවත ඉල්ලන අතර, මෙසේ කඩ කාමර කිහිපයක්ම වරින් වර ඔවුන් වෙත ලබා දී ඇති නිසා මේ සඳහා අපට සෘජුවම තීරණයක් ගැනීමට නොහැකි බැවින්, මේ සියළු කරුණු දන්වා පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ උපදෙස් ලබා ගැනීමට යොමු කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- එහිදී සමූපකාර සමිතිය සඳහා අංක 13 කඩ කාමරය ද ලබා දීම සුදුසු බවට ගරු පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ උපදෙස් අනුව එය ඔවුන්ට භාරදිය යුතු බවත්, එසේ අනුමැතිය නොලැබුණහොත් නැවත එය සභාවට යොමු කර මෙම කඩ කාමරය සම්බන්ධ තීරණයක් ගත යුතු බවටත් අජිත් අගලකඩ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මනෝජා ලක්මිණි මැතිතුමිය

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව කොවිඩ් වසංගතය හේතුවෙන් මේ දිනවල හුදකලා කර තිබෙන පාලාරුව ගම්මානයේ ජීවත් වන ජනතාවට ජුලි මස 08 වන දින සහන බඩු මළු බෙදා දුන් අතුල කුමාරසිරි ගරු මන්ත්‍රීතුමන්ටත් ප්‍රදීප් විතානගේ ගරු මන්ත්‍රීතුමන්ටත් ඒ සඳහා සහයෝගය දැක්වූ සියළු දෙනාටත් ගෞරවනීය ස්තුතිය පුද කර සිටින බවත්, ඒවගේ ම එම ජනතාවට වගා කර ගෙන ආහාර ලබා ගන්නා වට පිටාවක් කෙසේවත් නොමැති නිසා විශේෂ අවධානයක් මේ මොහොතේ ඔවුන් වෙනුවෙන් අපි දැක්විය යුතු අතර, වියළි ආහාරත් සමග උයාගෙන කෑ හැකි ආහාර සහ සෞඛ්‍යාරක්ෂිත උපකරණ ඔවුන්ට ලබා දිය යුතු බැවින්, ඒ සඳහා අවධානය යොමු කර කටයුතු කරන්න කියා ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම කොරෝනා නිසා රටේ අධ්‍යාපනය සම්පූර්ණයෙන් ම පසුබෑමකට ලක්වෙමින් පවතින අතර, රටක් වශයෙන් මේ මොහොතේ අධ්‍යාපනය වෙනුවෙන් කළ යුතු ම දේ සිදු

නොකර සිටීම ගැටළු සහගත බව ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළ අතර, දැනට මේ සඳහා ගුරුවරුන් විසින් ගෙන ඇති විකල්පයක් වශයෙන් On Line ක්‍රමවේදය හරහා දරුවන්ට අධ්‍යාපනය ලබා දුන්න ද ඒ සඳහා පහසුකම් ඇති දරුවන් පමණක් සම්බන්ධ වන අතර, නමුත් අධ්‍යාපනය තුළ සමාජ ගතවී ප්‍රදේශයක් දියුණු කළ හැකි දරුවන් බිහිවන්නේ ආකල්ප, කුසලතා දැනුම යන සංකල්ප තුන ඔස්සේ බැවින්, කොවිඩ් නිසා අධ්‍යාපනය නතර වී දිගු කාලයක් ගත වන අතර, දරුවන්ගේ මෙම සංකල්පයන් දියුණු කර ගත නොහැකිවීම පිළිබඳව ගුරුවරුන් වශයෙන් අප ඉතාමත් අසරණ වී සිටින බව ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම පසු ගිය දිනක මාධ්‍ය ඔස්සේ රටේ ප්‍රසිද්ධ ඇමතිවරයෙකු ගුරුවරයෙකුට කියූ බරපතල වචනයක් සම්බන්ධව තමා ගුරුවරියක් වශයෙන් කතා කළ යුතු ම බවත්, ගුරුවරයා කියන චරිතය වර්ණනා කරන ඈත අතීතයේදී සිට ම පත පොත පවා ලිය වෙමින් පැවතිය අතර, තමන්ගෙන් ඉගෙන ගන්නා දරුවන් ඉදිරියට යනවා බලා සතුටු වන එකම පුද්ගලයා ගුරුවරයා වන අතර, ඒ ගුරුවරයාට ප්‍රසිද්ධියේ ම කාලකන්නි යන වචනයෙන් බැන වැදීම සම්බන්ධයෙන් මේ සභාවේදී තමන්ගේ අප්‍රසාදය හා කනගාටුව ප්‍රකාශ කර සිටින බව සඳහන් කරමින් ගරු මන්ත්‍රීතුමිය සියළු දෙනාට ම ස්තුතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- නක්කලවත්ත හුදකලා කිරීමත් සමගම ප්‍රාදේශීය ලේකම් සමගත් සාකච්ඡා කර දින දෙකක් ඇතුළත රජයෙන් ලබා දෙන සහන මල්ල ඒ සියළුම පවුල්වලට බෙදා දීමට කටයුතු කළ බවත්, ඊට අමතරව චාමර මන්ත්‍රීතුමන් ඇතුළු කණ්ඩායමම සහ අතුල මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායමම ඔවුන්ට සහන මළු ලබා දීමට කටයුතු කර ඇති අතර, නක්කලවත්ත ජනතාවට මේ මොහොතේ කිසිම අඩුපාඩුවක් වීමට ඉඩ නොතබන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

- ඒ වගේ ම ගුරුවරුන් ගැන කතා කිරිමේදී හොඳ ගුරුවරුන් අතර නරක ගුරුවරුන් ද සිටින අතර, මේ මොහොතේ දරුවන්ට උගන්වන එකත් පසෙක ලා ලේකම් කෙනෙක් වෙනුවෙන් ස්ට්‍රයික් කිරිම දරුවන්ට කරන මහත් අසාධාරණයක් සේම දරුවන්ගේ මෙන් ම ගුරුවරුන්ගේ ද ආකල්ප දියුණු විය යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර, මොනරාගල ප්‍රසිද්ධ පාසල්වල පෙරටුගාමී කණ්ඩායමේ ගුරුවරුන් බොහෝ පිරිසක් අන්තවාදී ලෙස කටයුතු කරමින් සිටින අතර, හොඳ ගුරුවරුන්ට කවදත් අපි ගෞරව කරන බවත් දරුවන් ගැන නොසිතා මෙසේ කටයුතු කරන ගුරුවරුන්ට කවදාවත් හොඳක් සිදු වන්නේ නැති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

<u>අජිත් අගලකඩ මන්ත්‍රීතුමා</u>

- මේ වන විට ගුරුවරුන් ස්වේඡාවෙන් ඉදිරිපත් වී තමන්ගේ ම වියදමින් දරුවන් වෙනුවෙන් On Line Class සිදු කර ගෙන යන අතර, මේ වෙනුවෙන් රජයෙන් කිසිම සහයෝගයක් ගුරුවරුන්ට ලබා නොදෙන අතර, ගුරුවරුන් දරුවන්ට අසාධාරණකම් කරනවා කියා චෝදනා කිරිම වැරදි බවත් ඒ වගේ ම ගුරුවරුන්ගේ සමිතියක ලේකම් කෙනකුට සිදුවූ අසාධාරණයක් වෙනුවෙන් මෙසේ ගුරුවරුන් පෙනී සිටීම වැරැද්දක් නොවන බවත්, ඒ පෙනී සිටින්නේ ද දරුවන් වෙනුවෙන් බවත් ගරු මන්ත්‍රීතුමා නැවත ප්‍රකාශ කර සිටින ලදි.

## 8.3 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.බණ්ඩාර මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව දැයේ දරුවන්ගේ නුවණැස පාදන්න දැනුම, කුසලතා, ආකල්ප යන සංකල්පයන් ඔස්සේ දරුවන් බිහිකළ පිරිසක් වශයෙන් ගුරුවරයා හඳුන්වන අතර, "ඔබට දෙවියකු විය නොහැකි නම් ගුරුවරයෙකු වන්න" කියන පැරණි කියමනෙන් ඒ බව මනාව ඔප්පු වන බවත්, අද රටේ සියළුම ක්ෂේත්‍ර නියෝජනය කරන ජනතාවක් නිර්මාණය වී ඇත්තේ ඉගෙන ගත් ගුරුවරුන්ගේ මාර්ගෝපදේශයන් යටතේ බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින අතර, වැටුප් විෂමතාවය යටතේ කම්කරුවාට වඩා ඉතා අඩු සොච්චම් පඩියක් ගන්නා ගුරුවරයාට අද හිමිව තිබෙන තැන සම්බන්ධව ඉතාමත් කනගාටු වන අතර, රටේ තත්ත්වයන් සමග ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී තමන්ගේ ම වියදමින් On Line ක්‍රමය හරහා දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන අතර, මේ සඳහා රජයෙන් කිසිදු මුදලක් වැය නොකරන බවත්, ඒ වගේ ම කොරෝනා වසංගතය නිසා අවුරුද්දක් පමණ පාසල් වසා තැබීමට සිදු වුවත්, අද වන තුරා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් කිසිදු වැඩපිළිවෙලක් රජය විසින් නොගත් අතර, වැරදි කරන අය රටේ සෑම ක්ෂේත්‍රයක ම සිටින බවත් තමන් දේශපාලනයට ආවේ මීට වඩා දෙයක් රට වෙනුවෙන් කරන්න බලාපොරොත්තුවෙන් වුවත් අද වන තුරු ඊට එහා දෙයක් සිදු නොවීම සම්බන්ධවත් මේ රට ගලා ගෙන යන මාර්ගය ගැන තමන්ට කලකිරීමක් පවතින බවත්, මොන ආණ්ඩුව යටතේ වුවත්, නිවැරදි දේ සිදු විය යුතු බවත්, ගුරුවරුන් සම්බන්ධව මාධ්‍ය හරහා ඒ ඇමතිවරුන් කරන ලද ප්‍රකාශයට දැඩි වේදනාවක් ගෙන දෙන බවත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨය හා එහි අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සම්බන්ධව මාධ්‍ය හරහා විශේෂ කතා බහට ලක් වන අතර, යහ පාලන ආණ්ඩු සමයේදී ද මෙහි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙන ආවත්, ඒවා ක්‍රියාත්මක කිරීමට ඉඩ නොදී දැන් ඒවා නැවත ක්‍රියාත්මක කිරීමට යාම තුළින් මේ වැරදි ඉතා බරපතල පනතවල් ක්‍රියාත්මක කිරීම කිසිසේත් ම සිදු නොවිය යුතු දෙයක් බවත්, රජයේ විශ්ව විද්‍යාලවලට මෙය මහත් බලපෑමක් වන බවත්, රජයේ විශ්ව විද්‍යාලවලට මෙය මහත් බලපෑමක් වන බවත්, පුද්ගලික විශ්ව විද්‍යාල ප්‍රතිශංස්කරණය විය යුත්තේ රජයේ විශ්ව විද්‍යාලවලට කිසිදු බලපෑමක් සිදු නොවන ආකාරයට බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අතර, අධ්‍යාපන වෘත්තිකයන් පවා පෙනී සිටින්නේ මෙම අසාධාරණකම්වලට එරෙහිව වන අතර, විශේෂයෙන් ම රටේ දේශපාලඥයින්ට වඩා බිම් මට්ටමේ අයගේ සිතන පතන දේවල් වෙනස් බැවින්, හැමෝම ඉතා පරීක්ෂාකාරිව වගකීමෙන් කටයුතු කළ අතර, ගරු ජනාධිපතිතුමන්ට තනියම මේ ගමන යා නොහැකි වන බැවින්, කැබිනට්ටුවේ සියළු දෙනා ම ඇතුළුව සමස්ථ දේශපාලන උදවිය රටේ මෙවැනි ප්‍රශ්නවලදී ඉතා සානුකම්පිතව මධ්‍යස්ථව තීන්දු තීරණ ගත යුතු බවත්, ඒ වගේ ම කාලකණ්නි ගුරුවරුන් වගේ ම කාලකණ්නි දේශපාලඥයින්, කාලකණ්නි වෛද්‍යවරුන්, ඉංජිනේරුවන් සෑම ක්ෂේත්‍රයක ම සිටින අතර, මේ අතර සිටින හොඳ අය සෑම ඇගයීමට ලක් විය යුතු බවත්, අපි සෑම කෙනෙක් ම මෙතැන සිටින්නේ ගුරුවරුන් නිසා වන අතර, කාලකණ්නි කියා ගුරුවරුන් හැඳින්වීම දැඩි පිළිකුලෙන් හෙළා දකින බව ප්‍රකාශ කරමින් සියළු දෙනාට ම ස්තුතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- රටේ පවතින සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට හා ඊට අදාළ නීති රීතිවලට අනුව මෙම වෘත්තිය සමිති නායකයා නිරෝධායනයට දැමීමේ කිසිම වැරද්දක් නොමැතිව වන අතර, ඒ සඳහා ගුරුවරුන් ස්ට්‍රයික් කරන්නේ ඇයි ද යන්න ගැටළුවක් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර, මේවා විවිධ සුළු පක්ෂවල දේශපාලන උවමනාවන් මත සිදුවන බවත්, රටේ පවතින තත්ත්වයන්

සමග මෙවැනි ස්ට්‍රයික් පැවැත්වීම ඉතාමත් වැරදි පාපකාරි ක්‍රියාවක් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේ ම කොතලාවල වෛද්‍යා පියය ගැන අපි කලබල විය යුතු නැති අතර, රටේ නායකයින් ඒවාට සුදුසු නිවැරදි තීන්දු තීරණ ගනියි යන්නත් ප්‍රකාශ කර සිටින ලදී.

## 8.4 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සුනිල් අරංගල මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව පසුගිය කාලයේ මාධ්‍යජාලාවලින් දැන ගැනීමට හැකිවූ කාරණාවක් වන සමගි ජන බල වේගයේ නියෝජිතයින් නැවත එක්සත් ජාතික පක්ෂය වැළඳ ගෙන ඇති අතර, ඉදිරි කටයුතු වෙනුවෙන් මේ සභාවේ සිටින එම නියෝජිතයින් 05 දෙනා කුමන පක්ෂයක් නියෝජනය කරනවා ද යන්න මුලින් ම දැන ගැනීමට අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම ගුරුවරුන් සම්බන්ධ ව කතා කිරිමේ දී පාසල් වැසීමත් සමග ගුරුවරුන් සහ දරුවන් නිවසට සීමා වුව ද ගුරුවරුන්ට අයත් වැටුප මාස්පතා ලබා දුන් බවත්, ගුරුවරුන් Zoom තාක්ෂණය හරහා දරුවන්ට On Line මගින් ඉගැන්වීමේ කටයුතු සිදු කළ අතර, මේ සඳහා දරුවන්ට මසකට වැය වන්නේ රුපියල් එකසිය ගණනක් වැනි පුංචි මුදලක් වන අතර, රටේ පවතින මෙවැනි අවස්ථාවකදී වෘත්තීය සමාගම් සමග එක්වී ස්ට්‍රයික් කිරිම ගුරුවරුන්ට කිසිසේත් ම සුදුසු නොවන බවත්, රටේ අනාගතය බාර ගැනීමට සිටින දරුවන්ගේ අධ්‍යාපනය නතර කර තම තමන්ගේ පක්ෂවල අභිලාෂයන් ක්‍රියාත්මක කරන මුවාවෙන් මෙම වැඩ වර්ජනයන් සිදු කර ගෙන යන්නේ නම් එය දැඩි ලෙස හෙළා දකින බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

III. රටක් වශයෙන් පසුගිය කාලයේ පැවති විවිධ කැරලි, යුද්ධය, විවධ වසංගත, දේශගුණික විපර්යාසයන් නිසා රට බොහෝ පසුබැම්වලට ලක් වූ බවත්, පවතින රජයට කවුරුන් හෝ අකුල් හෙළනවා නම් ගැටළු ඇති කරවනවා නම් රටක් වශයෙන් ඉදිරි අනාගතය ම පසුබෑමට හා විනාශයට ලක්වන බව කවුරුත් අවබෝධ කර ගත යුතු බවත්, ඒ වගේ ම කොතලාවල අධ්‍යාපන පියය සඳහා සංශෝධන පනතක් ගෙන ආ නමුත් එහි ස්ථිර තීරණයන් ගැනීමටත් ප්‍රථම මෙවැනි ගැටළුකාරි තත්ත්වයන් ඇති කරවමින් රට ජාතිය අපකීර්තියට පත් කරවීම සුදුසු නොවන බවත් ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටි අතර, මෙවැනි මොහොතක රටේ සියළුම අංශ නියෝජනය කරන අයවළුන්ගේ යුතුකම හා වගකීම වන්නේ මේ වසංගතවලින් රටේ ජනතාව බේරා ගෙන ඉදිරියට යාමේ වැඩපිළිවෙළක් වන අතර, සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් නොතකා කඩාකප්පල්කාරි ලෙස අයිතිවාසිකම් දිනා ගැනීමට මේ සුදුසු මොහොතක් නොවන බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. ඒ වගේ ම රටේ කොරෝනා එන්නත්කරණය මේ වන විට සාර්ථකව කර ගෙන යන අතර, අපේ බල ප්‍රදේශය තුළ ද වගකිව යුතු පාර්ශවයන්ගේ මැදිහත් වීමෙන් ගැටළු සහගත නොවන අයුරින් එම කටයුතු සිදු කර ගෙන යාම ඒ භාරව කටයුතු කරන සියළු දෙනාට ම ස්තුති වන්න වන බවත්, ඒ වගේ ම ප්‍රදේශයේ සියළුම ජනතාව ආවරණය වන පරිදි එන්නත්කරණය සිදු කිරිමට කටයුතු කරන්න කියා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

V. ඒ වගේ ම කොරෝනා වසංගතයේදී ජනතාවට සහන දීමේ පදනම මත රජය විසින් සමෘද්ධි අධිකාරිය හරහා ලබාදුන් රු.5000/= දීමනාව මෙන් ම පසුගිය අප්‍රේල් මාසයේ සමෘද්ධිය

හරහා අඩු ආදායම්ලාභී සියළුම ජනතාවට විදුලිය ලබා දෙන ලෙස රජයෙන් චක්‍ර ලේඛන ඉදිරිපත්වූ අතර, මේ සහනාධාර හා සේවාවන් ලබා ගැනීමට හිමිකම් සහිත බොහෝ දෙනකුට තවමත් ඒවා නොලැබී ඇති බැවින්, මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්ට මෙන්ම සමෘද්ධි අධිකාරී වෙත ලිඛිතව දන්වා යවා මේ වරප්‍රසාද හිමි සියළුම ජනතාව අසාධාරණයකින් තොරව ඒවා ලබාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ප්‍රකාශ කරමින් සමගි ජන බල වේගය නියෝජනය කරමින් මේ සභාවේ සිටි සියළුම මන්ත්‍රවරුන් මන්ත්‍රිවරියන් නැවත එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් අද දින පෙනී සිටීම සම්බන්ධව සුභ පැතුම් එක් කරන බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තූතිය පුද කර සිටන ලදි.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- අඩු ආදායම්ලාභී පවුල්වල රු.5000/= දීමනාව නොලැබුණු අය සම්බන්ධව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී තමන් සඳහන් කර සිටි බවත්, ඒවගේ ම විදුලිය සම්බන්ධ ප්‍රශ්නයේදී ද ඒ සම්බන්ධව කටයුතු කළ නිලධාරින්ගේ අඩුපාඩු නිසා යම් යම් පවුල් මඟ හැරී ඇති අතර, මේ වන විට එම නිලධාරින් වෙනුවට නව කණ්ඩායමක් ඒ සඳහා යොදවා ඇති බැවින්, පැවති අඩු පාඩු නිරාකරණය කර ගත හැකි බවත්, කෙසේ නමුත් සෑම තැනකම කඩා කප්පල්කාරින් සිටින නිසා සිදුවන මේ අතපසුවීම් සෑම දෙයක් ම නිවැරදි කර ගමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.5 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අතුල කුමාරසිරි මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකු වශයෙන් පසුගිය දින දිවුරුම් දීම සම්බන්ධව පක්ෂයේ අය සියළු දෙනාගේ ම ගෞරවණීය ස්තූතිය ප්‍රකාශ කර සිටින බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම මොනරාගල, නක්කල ගඟබඩ පාර කිලෝ මීටර් 03 ක් පමණ කාපට් කර අළුතින් සකස් කර තිබීම සම්බන්ධව ඉතා අගය කළ යුතු කරුණක් වුව ද පසුගිය දිනක සිරස මාධ්‍ය ආයතනය ද කැඳවා සභාව නියෝජනය කරන මන්ත්‍රිවරයෙක් ද ඇතුළුව පිරිසක් එකතු වී එහි අඩු පාඩු ගොඩාක් ඇති බව පෙන්වා දෙමින් රජයෙන් කළ වැඩත් විවේචනය කිරීමක් සම්බන්ධව තමන් කනගාටු වන බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී. ඒ වගේ ම ජීලෝන් ජල මූලාශ්‍රය හරහා මිනිස් මල හා අපද්‍රව්‍ය බොහෝමයක් සහිතව පාරිභෝගිකයින් හට ලැබෙන බවට පසුගිය ලංකාදීප පුවත්පතේ සඳහන් වී ඇති අතර, ප්‍රාදේශීය සභාව නියෝජනය කරන අපව ද දැනුවත් නැතිව මේ සම්බන්ධව මාධ්‍ය හරහා නිකුත් වීම කනගාටුදායක වන බවත්, නමුත් මේ සම්බන්ධව පැහැදිලි වාර්තාවන් ලබා ගෙන ඉතා කඩිනමින් අවශ්‍ය තීන්දු තීරණ ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම ගුරුවරුන්ගේ ප්‍රශ්නය ගැන කතා කිරිමේදී වෘත්තීය සමිති නියෝජනය කරන නායකයින්ට තමන්ගේ අදහස් ඉදිරිපත් කිරිමට විසඳුම් ලබා ගැනීමට ප්‍රජාතන්ත්‍රවාදී රටක් වශයෙන් අයිතියක් තිබිය යුතු අතර, මේ විරෝධතාවලට විසඳුමක් වශයෙන් ගරු ජනාධිපතිතුමන් හොඳ තීරණයක් ලබා දෙනු ඇති බවත්, ඒ වගේ ම මෙම උද්සෝෂණවලදී ස්වාමින් වහන්සේලා පෙනී සිටීම වැරද්දක් නොවන අතර, ආදි සිංහල රජ කාලේ පවා බොහෝ දේවල් විසඳා ගැනීමට ස්වාමින් වහන්සේලා ඉදිරිපත්ව කටයුතු කළ අතර, පසුගිය ආණ්ඩුව යටතේ සයිටම් අධ්‍යාපන පීඨය වෙනුවෙන් ඇතිවූ ගැටළුවේදීත් උද්සෝෂණ 3000

ක් පමණ පැවති අතර, එක් එක් දේශපාලන හේතූන් මත කවුරුන් හෝ විවිධ අරමුණු මත මෙවැනි තත්ත්වයන් ඇති කරන බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. ඒ වගේ ම බුත්තල මහගොඩයාය ප්‍රදේශයේ පවත්වා ගෙන යනු ලබන කොරෝනා නිරෝධායන මධ්‍යස්ථානයේ සිටින රෝගීන්ට කිසිම සොයා බැලීමක් හෝ සැලකීමක් දක්වන්නේ නැති බවටත්, රෝගියෙකු බරපතළ ලෙස ආසාදනය වන තුරුම ඔවුන් සම්බන්ධව සැලකිල්ලක් නොදක්වන බවට තොරතුරු ලැබී ඇති බැවින්, මේ සම්බන්ධව අදාළ සියළුම තැන්වලට දැනුම් දී මේ අසරණ රෝගීන් සම්බන්ධ අවශ්‍ය කටයුතු කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

V. ලංකාව වැනි රටක් දියුණු වීමේදී හොඳම ආයෝජනය වන්නේ අධ්‍යාපනය වෙනුවෙන් යොදවන මුදල් බවත්, ලංකාව වැනි රටකට ඉදිරියට යා හැකි එකම මඟ අධ්‍යාපනය වන අතර, රටේ මොන ප්‍රශ්න තිබුණත් රජයක් වශයෙන් රටේ අධ්‍යාපනයට මුල් තැන දී කටයුතු කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදී.

VI. ඒ වගේ ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් තෙනගල්ලන්ද, ඉත්තෑකටුව බොහෝ ඉඩම් ප්‍රමාණයක් වෙනත් ප්‍රදේශවල අයවළුන්ට ලබා දීමට කටයුතු කර ගෙන යන බවට තොරතුරු ලැබී ඇති අතර, මෙම බල ප්‍රදේශයේ ඕනෑ තරම් ගොවි ජනතාවක් සිටින බැවින්, මොන ක්‍රමයකට හෝ මේ ඉඩම් අපේ වගා කරන ජනතාව අතර ම බෙදා දීමට කටයුතු කිරීමට කෙසේ හෝ මැදිහත් වී මේවාට සුදුසු කටයුතු කරන්න කියාත්, ඒ වගේ ම සමූපකාරය වැනි ආයතනයට තම ව්‍යාපාරය කර ගෙන යාමට කඩ කාමරයක් ලබාදීම ඉතාමත් සුදුසු බැවින් ගිවිසුම් මගින් කොන්දේසි පනවා හෝ ඔවුන් විසින් ඉල්ලුම් කරන ඒ අංක 13 කඩ කාමරය ලබාදීමට කටයුතු කර දෙන ලෙසට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අතර, ඒ වගේ ම තම කණ්ඩායම කවදත් පෙනී සිටින්නේ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරමින් සියළු දෙනාට ම ස්තුතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- නක්කල ගහබඩ පාරේ ගැටළුව සම්බන්ධව තමන් අදාළ ඉංජිනේරු මහතාගෙන් විමසා සිටියදී, ඔහු පවසා සිටියේ මාර්ගය සකස් කර ගෙන යාමේදී ඇතිවන පොඩි පොඩි අඩුපාඩුකම් පැවතිය ද මාර්ගය සම්පූර්ණ කර භාර දෙන විට ඒ අඩුපාඩු සියල්ල ම සකස් කරන බවට උපදෙස් ලබාදුන් බවත්, මෙය ප්‍රශ්නයක් ඇතිවන දෙයක් නොවන බවත් කෙසේ නමුත් මෙවැනි දේවල් මන්ත්‍රීවරුන් වශයෙන් සොයා බැලිය යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේ ම ජීලෝන් ජල මූලාශ්‍රයේ ජලය සම්බන්ධව අදාළ කළමණාකාරතුමිය සමග සාකච්ඡා කළ අතර, මේ මාධ්‍ය හරහා යන කතාව ඉඳුනිල් කියන මාධ්‍යවේදියෙකු විසින් පොලිසියේ ඉහළ සමහර නිලධාරින් සමග එකතු වී සිදු කර ගෙන යන මේ කටයුතු වගේ ම ජීලෝන් හි අහිංසක වතු ජනතාව විසින් වගා කර ඇති සියළුම ගස් කොළං විනාශ කර දමමින් මෙවැනි මඩ ප්‍රහාර ගෙන යන අතර, මෙසේ මාධ්‍ය හරහා ගෙන යන මඩ ප්‍රහාරයට විරුද්ධව තමන් පෙනී සිටින බවටත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේ ම මහගොඩ යාය නිරෝධායන මධ්‍යස්ථානය සම්බන්ධව කතාව ඇත්ත බවත් මේ සම්බන්ධව ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමන්ට දන්වා යවමු බවටත්, ඒ වගේ ම තෙනගල්ලන්ද ඉඩම්

ප්‍රශ්නය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා කර ගෙන යන වැඩපිළිවෙළක් වන අතර, මෙම ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා සැම දෙනා ම මැදිහත් වී කටයුතු කරමු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.6 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - චාමර නානායක්කාර මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව මේ වන විට අතිගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පයකට අනුව ගම් මට්ටමින් කිලෝමීටර් ලක්ෂයක් කාපට් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන්නා වූ මාර්ග නිසි ප්‍රමිතියකින් යුක්තව සිදු කෙරෙනවා ද යන්න අධීක්ෂණය කිරීම කොට්ඨාස භාර මන්ත්‍රීවරුන්ගේ වගකීමක් වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය මගින් මහ නැගුම ව්‍යාපෘතිය හරහා සිදු වන නක්කල ගහබඩ මාර්ගය කාපට් කිරීමේ ක්‍රියාවලියේදී එම ප්‍රදේශවාසීන් විසින් මෙම මාර්ගය සම්බන්ධව ඇති වූ ගැටළු රාශියක් තමන් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමාගෙන් ලද උපදෙස් අනුව ඒ සියළු දෙනාමත් සමග මෙම මාර්ගයේ ප්‍රශ්න ගැටළු සියල්ල අදාළ ආයතන සමග සාකච්ඡා කර විසඳුම් ලබා ගැනීමට හැකි වූ බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම පසුගිය දින මොනරාගල කඳුකර විවිධ සේවා සමුපකාරයේ නිලධාරින් මේ සම්බන්ධව අප සියළු දෙනා සමග සාකච්ඡා කළ බැවින් ප්‍රදේශයේ ඇති වටිනා සම්පතක් වශයෙන් මෙම සමුපකාරය විනාශ නොවී ආරක්ෂා කර ගත යුතු අතර, යම් හෙයකින් මොනරාගල පවතින මෙම ව්‍යාපාරය අකර්මන්‍ය වුවහොත් එය අප සියළු දෙනාට ම හොඳ තත්ත්වයක් නොවන බැවින් මේ සමුපකාර මණ්ඩලය විසින් අප සියළු දෙනාගෙන් මේ මොහොතේ ඉල්ලා සිටින කාරණාව සම්බන්ධව අප කවුරුත් අවධානය යොමු කර වගකීමකින් යුතුව අවශ්‍ය කටයුතු සිදු කරමු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම මේ මොහොත වන විට ගුරුවරුන් විසින් ගෙන යන වැඩ පිළිවෙළ සම්බන්ධයේදී අතුල මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ ලංකාවක් වැනි රටක ඉදිරි පැවැත්මට වටිනා ම හේතුව වන්නේ රටේ අධ්‍යාපනය බැවින් මේ ගුරුවරුන් විසින් ගෙන යන උද්ඝෝෂණ වැඩ පිළිවෙළ මේ මොහොතේ සිදු කිරීම ඉතාමත් සුදුසු නොවන කාරණාවක් වන අතර, කොරෝනා උවදුර නිසා වසර 02 ක් පමණ නිසි අධ්‍යාපනයක් ලැබීමට නොහැකි වූ දරුවන්ට ගුරුවරුන් විසින් ම සිදු කර ගෙන ගිය On Line ඉගැන්වීම් ද නතර කර දරුවන්ව ඉතාමත් අසරණ තත්ත්වයකට පත් කරවීම සම්බන්ධව දැඩි ලෙස හෙළා දකින බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. ඒ වගේ ම කොරෝනා උවදුරින් මොනරාගල ප්‍රදේශයට නක්කල වත්ත හරහා සිදු වීමට ගිය විශාල විනාශයකින් ආරක්ෂා කර ගැනිමට හැකිවීම සම්බන්ධ කටයුතු කළ සියළුම සෞඛ්‍ය අංශයේ නිලධාරින්ට ගෞරවණීය ස්තූතිය පුද කර සිටින බවත්, ඒ වගේ ම මේ වන විට නක්කලවත්ත ආසාධිතයින් 80 ක් පමණ සිටින අතර, මෙම ප්‍රදේශය හුදෙකලා කිරීමත් සමග මේ වන විට එම ජනතාවට අවශ්‍ය වියළි ආහාර කිසි ම අඩු පාඩුවකින් තොරව ලැබී ඇති අතර, රජයේ 5000/= වියළි ආහාර මල්ල, රාජ්‍ය නොවන සංවිධානයකින් ලක්ෂ 11 ක් ද, තමන්ගේ මැදිහත් වීමෙන් ලක්ෂ 2 ½ ක් ද, විවිධ ව්‍යාපාරිකයින් විසින් හා අපේ නව මන්ත්‍රී කණ්ඩායම් විසින් ද සම්පූර්ණ වශයෙන් ලක්ෂ 30 කට පමණ ආසන්නව සියළුම පවුල් ආවරණය වන පරිදි වියළි ආහාර මළු ලබාදී ඇති අතර, ඔවුන්ට මේ මොහොතේ ඕනෑතරම් ආහාර ද්‍රව්‍ය ලබා දී ඇති අතර, මෙම තත්ත්වය දිගට ම පැවතීම තුළින් ජනතාව

අපහසුතාවයට පත් වුවහොත් ඒ ප්‍රශ්න ද විසඳීමට අපි සියළු දෙනා ම මැදිහත් වී අවශ්‍ය කටයුතු කරමු බවටත් ඒ වගේ ම මේ ජනතාව වෙනුවෙන් වියළි ආහාර ලබා දීමට දායක වූ සහ සහයෝගය දැක්වූ සියළුම දෙනාට ස්තූතිය පුද කර සිටින බවටත් ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදී.

V. ඒ වගේ ම තමන් නියෝජනය කරන නක්කල කොට්ඨාසයේ අක්‍රිය වූ සහ අළුතින් සවි කිරීමට අත්‍යාවශ්‍ය වීදි ලාම්පු ප්‍රමාණයක් ඇති බැවින්, ඒ සඳහා සහයෝගය ලබා දෙන ලෙසත් ඒ වගේ ම කපා ගැනීමට නොහැකි වූ අතුරු මාර්ග කිහිපයක් ම පවතින බැවින්, ඉදිරි වැසි සමයට ප්‍රථම මෙම කටයුතු සිදු කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, රජයෙන් මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතිය යටතේ මේ වන විට බොහෝ මාර්ග කාපට් කර අවසන් අතර, ඉදිරියේදී බල ප්‍ර දේශය තුළ ද මාර්ග සකස් කිරීම, නිවාස ලබා දීමේ හා ජල පහසුකම් ලබා දීමේ ව්‍යාපෘති දියත් කිරීමට නියමිතව පවතින බවත්, යුද්ධයක් හා සමාන කොරෝනා වසංගතයත් සමග මේ සඳහා කාලය යොදවා ගැනීමේ යම් යම් අපහසුතා මතු වුව ද ඉදිරියේදී මේ සියල්ල ම සාර්ථක වන බවට සඳහන් කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාට ම ස්තූතිය පුදකර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- මෙම ව්‍යාපෘතිය හරහා මාර්ග කාපට් කළ ද කොන්ත්‍රාත් කරුවන් මගින් යම් යම් අඩු පාඩු සිදු විය හැකි බැවින් වසම් භාරව සිටින මන්ත්‍රීවරුන් නිරතුරුව මෙම කටයුතු අධීක්ෂණය කිරීම වගකීමක් බවත්, ඒ වගේ ම සෞඛ්‍ය අංශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ දැඩි කැපවීම මත නක්කලවත්ත හරහා කොරෝනා උවදුර මගින් සිදු වීමට ගිය මහා විනාශයක් නතර කර ගැනීමට හැකි වූ බවත්, ඒ වගේ ම ඉදිරියේදී අතුරු මාර්ග සඳහා වීදි ලාම්පු සවි කිරීම් කටයුතු දිගට ම කර ගෙන යන අතර, ඒ සඳහා සොයා බලා කටයුතු කරමු යන්නත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.7 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව මොනරාගල, රත්තනපිටිය ප්‍රදේශයේ ජනතාවට ගමන් කිරීමට නොහැකිව ඉතා අබලන් තත්ත්වයේ පැවති මොබිටෙල් කුළුණ මාර්ගය තමන්ගේ දැනුම් දීම මත ගරු සභාපතිතුමාගේ මැදිහත් වීමෙන් බැකෝ යන්ත්‍රය යොදා සකස් කර දීම සම්බන්ධයෙන් එම ප්‍රදේශවාසීන් විසින් ස්තූතිය පුදකර ලිපියක් ලබා දී ඇති බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී. ලෝක වසංගතයකට මුහුණ දී රටක් වශයෙන් අපහසුතාවයකට පත්ව ඇති මොහොතක පටු අරමුණු හා අවස්ථාවාදී ක්‍රියාවන් අරමුණු කර ගනිමින් අරගල පැවැත්වීම සම්බන්ධව ගැටළු සහගත තත්ත්වයක් මතු වන අතර, නමුත් සමාජයක් ගොඩනැංවීමට මේ දේවල් සිදු වනවා නම් එහි ගැටළුවක් නොවන බවත්, ගුරු භූමිකාව නිවැරදිව සිදු කරන ගුරු දෙව්වරුන්ට කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමන් එසේ ප්‍රකාශයක් නොකළ අතර, කෙසේ නමුත් රටේ අධ්‍යාපනය පසු බෑමකට ලක්ව ඇති මොහොතක රජයක් වශයෙන් දරුවන් සම්බන්ධව දෙයක් සිදු කිරීමට අනුගත වෙමින් පවතින මොහොතක් වශයෙන් රටේ පවතින වසංගතයන් සමග මෙම ගැටළුව දේශපාලන වාසියක් බවට පෙරළා ගන්නවා ද, එසේ නොමැති නම් පුද්ගලයන් වශයෙන් මෙයට ඇහුම්කම් දෙන හා දකින ආකාරය පිළිබඳව අවධානය යොමු කරන්නේ කෙසේ ද යන්න තීරණය කළ යුතුව ඇති බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම අප කවුරුත් මේ සමාජානුගත වී සිටින්නේ අපේ ගුරුවරුන් විසින් ලබා දුන් පන්නරය නිසා වන අතර, අපි අනුකරණය කරනුයේ ද ඔවුන්ම වන බවත්, නමුත් පසුගිය සිදුවීම මගින් ගුරුවරුන්ගේ හිත් රිදවීමක් සිදුවූවා නම් එය අසුභ ලක්ෂනයක් වන අතර, ඒ සඳහා කනගාටුව ප්‍රකාශ කර සිටින බවත්, වැඩකට නැති සමාජයට පිළිලයක් වූ ගුරුවරුන් ද අප අතර සිටින බවත්, ඊට හොඳම නිදසුන වශයෙන් පසුගිය දිනවල රෝහලට පැමිණෙන රෝගීන්ට බෙහෙත් ටික දෙනවාට, ට්‍රොලියේ රුගෙන යාමට වැනි කාරණා කිහිපයක් ම ගොනු කර ගනිමින් රෝහලේ සේවකයින් විසින් උද්ඝෝෂණ පැවැත්වීම හඳුන්වා දිය හැකි බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදී. ඒ වගේ ම පෞද්ගලික විශ්ව විද්‍යාලවලට අප කවුරුත් කලබල විය යුතු නොමැති අතර, රටේ සිටින ඉහළ දේශපාලන අධිකාරිය විසින් ඒ සඳහා ගත යුතු නිවැරදි තීන්දු තීරණ ගනියි බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලද අතර, ඒ වගේ ම ගුරුවරුන්ට හා දරුවන්ට Zoom On Line ඉගැන්වීම් කටයුතු සඳහා නොමිලේ ඇප් එකක් හඳුන්වා දීමට යන බවත්, ඊට අමතරව ප්‍රශ්නයක් ආවොත් සියළුම පාසල් විදුහල්පතිවරුන්ට අධ්‍යාපන අමාත්‍යාංශය මුදල් වෙන් කර ඇති බවටත් තොරතුරු ලැබී ඇති බවත්, ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම කොට්ඨාසයේ ගැටළු සම්බන්ධව සභිකවරුන් වශයෙන් අප විමසන කරුණු සඳහා ගරු සභාපතිතුමාගේ අත්සනින් අදාළ ආයතන වෙත ලිපි යොමු කර තිබුණත් ඒ වා සඳහා ලැබෙන පිළිතුරු ලිපි අපට මෙතෙක් ලැබී නොතිබීම සම්බන්ධ කරුණු විමසා සිටින බවත්, ඒ වගේ ම මරගල කන්ද ගැන කතා කිරිමේදී එදා මෙදා තුර ගත කළ විශාල පවුල් සංඛ්‍යාවක් ජීවත් වන අතර, මේ වැඩිවන සියළුම පවුල් කන්ද තුළම ජනාවාස වුවහොත් මරගල කඳු වැටිව විනාශ වන හෙයින් මේ අහිංසක ජනතාවට සින්නක්කර ඔප්පු සහිතව වෙනත් වාසස්ථාන සකස් කර දී මේ කඳු වැටිය සංරක්ෂණය කිරිමේ දීර්ඝ හා කෙටි කාලීන විසඳුම්වලට යෑම අනිවාර්ය වන අතර, මේ වන විට මෙම කඳු වැටියේ පවතින තත්ත්වය සම්බන්ධයෙන් ප්‍රදේශයේ රාජ්‍ය යාන්ත්‍රණය ක්‍රියාත්මක කරන සියළුම පරිපාලන නිලධාරින් ඇතුව දේශපාලන අධිකාරිය පූර්ණ වශයෙන් වගකිව යුතු අතර, අද වන විට මේ වතු ජනතාව විසින් විවිධ වගා කටයුතු සඳහා විනාශ කරමින් පවතින මේ කඳු වැටිය සම්බන්ධව සොයා බලන ලෙසත්, ඒ වගේ ම පසුගිය අවුරුදු 15 ක් ඇතුළත මරගල කඳු යායේ ජීවත් වූ සියළුම පවුල් සම්බන්ධ විශ්ලේෂනයක් කර ප්‍රාදේශිය ලේකම් මගින් සියළු තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන ලෙසත්, මේ සියළු ජනතාව වෙනත් ස්ථානවල පදිංචි කර මරගල කඳු වැටිය ආරක්ෂා කිරිම අපගේ වගකීම බැවින් හිත් රිදවීම්, අඩුපාඩුකම් පසෙකලා සියළු දෙනා ම මැදිහත් වී මේ කටයුතු නිවැරදි කර ගැනීමට කටයුතු කරමු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. ඒ වගේ ම මොනරාගල ප්‍රදේශයේ කොවිඩ් එන්නත් කරන වැඩ පිළිවෙළ ඉතාමත් සාර්ථකව කර ගෙන යාම සම්බන්ධව කටයුතු කරන සියළුම දෙනාට ස්තුතිය පුද කර සිටින බවත්, ඒ වගේ ම කොට්ඨාසයේ අතුරු මාර්ග කැපීම් හා සංවර්ධන කටයුතු සිදු කිරිම සම්බන්ධව අවධානය යොමු කළ යුතු බවත්, ඒ වගේ ම අක්‍රිය වීදි ලාම්පු සියල්ල නැවත සවි කිරිමට කටයුතු කළ යුතු අතර, සිරිගල රෝහල අසල යොදා ඇති ආලෝකය වැඩි වීදි ලාම්පු තව කිහිපයක් කඩිනමින් සවි කළ යුතු බවත්, ඒ වගේ ම ඒ ස්ථානයේ පවතින වාහන තදබදයට විසඳුමක් ලබාදී ඒ අසල බොහෝ වේලාවක් රැඳී සිටීමට සිදුවන රෝගීන්ගේ පහසුව සඳහා සුදුසු වැඩපිළිවෙලක් යෙදවීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස සඳහන් කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාට ම ස්තුතිය පුද කර සිටින ලදී.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

- රෝහල් සේවකයින් විසින් කරනු ලැබූ විරෝධතාවය ගැන සොයා බැලීමේදී බොහෝ පිරිසක් පෙරටුගාමී කණ්ඩායම්වල සාමාජිකයින් බවට පත්ව මේ අරගල දියත් කරන බවත්, ඒ වගේ ම ප්‍ර දේශයේ එන්නත්කරණය ඉතාමත් සාර්ථකව කර ගෙන යන අතර, මේ තාක් ගැටළුවක් ඇති වී නොමැති බවත්, ඒ වගේ ම Zoom තාක්ෂණයෙන් සිදු කරන අධ්‍යාපන කටයුතු සම්බන්ධ පසුගිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී අඹන්වල මැඩම් විසින් ලබා දුන් උපදෙස් මත පළාත් සභා පාසල්වල මේ වන විටත් ආරම්භ කර ඇති බවත්, ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී. වීදි ලාම්පු අවශ්‍ය ස්ථානවල සවි කරමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.8 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ගුණවර්ධන මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව තමා ද අධ්‍යාපනය වෙනුවෙන් සේවාවක් කළ ගුරුවරයෙකු වශයෙන් මේ දිනවල පවතින අරගලය සම්බන්ධව කතා කළ යුතු ම අතර, රටේ පවතින වසංගත තත්ත්වය හමුවේ ගුරුවරුන් වශයෙන් දරුවන්ගේ අධ්‍යාපනයෙන් වෙන්වී වෙනත් කටයුතු කිරිම සම්බන්ධව ඉතාමත් කනගාටුදායක තත්ත්වයක් වන අතර, මේ වන විට රජය හරහා සියළු පාසල්වලට දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් අවශ්‍ය පහසුකම් ලබාදී ඇති අතර, ඒ වගේ ම පාසල්වලට ගුණාත්මක යෙදුම් ලබා දෙන අතර, නොබෝ දිනකින් ම පාසල් නැවත විවෘත වීමට ඉඩ ඇති බවත්, ගමක, රටක, ලෝකයක දියුණුව රදා පවතින්නේ එහි අධ්‍යාපනය තුළින් වන අතර, විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් මේ සියළු කටයුතු නිසි පරිදි කළමනාකරණය කර ගනිමින් නිවැරදිව කටයුතු කළ යුතු බවට ගරු මන්ත්‍රිතුමා අදහස් දක්වා සිටින ලදී.

II. ඒ වගේම අප ප්‍රාදේශිය සභාව නගර සභාවක් බවට පත් කරවීම සම්බන්ධව මීට වසර 02 ක පමණ කාලයක සිට සාකච්ඡා වෙමින් පවතින අතර, අපගේ දේශපාලන කාලය ද තව කෙටි කලකින් අවසන් වීමට ද නියමිත බැවින්, නගර සීමාව නගර සභාවක් කිරිමට අවශ්‍ය කටයුතු සැලසුම් කරන ලෙසට ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම මීට වසරකට දෙකකට පෙර පළාත් පාලනය හරහා ගම් මට්ටමින් යෝජනා ගෙන සංවර්ධන සැලසුම් සකස් කළ අතර, එය ක්‍රියාත්මක නොවුනු අතර, ඒ සම්බන්ධව අද පවතින ප්‍රගතිය සම්බන්ධවත් ඒ වගේ ම නාගරික සංවර්ධනය යටතේ කෝටි 100 ක් පමණ ව්‍යාපෘතියක් සම්බන්ධව ද සැලසුම් සකස් කළ අතර, මේ වන විට එහි ප්‍රගතිය සම්බන්ධව දැන ගැනීමට අවශ්‍ය බව ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. ඒ වගේ ම අතිගරු ජනාධිපතිතුමන් ඇතුළු ඉහළ දේශපාලන අධිකාරියේ මග පෙන්වීම මත රට තුළ මෙන් ම බල ප්‍රදේශයේ ද සෞඛ්‍ය තත්ත්වය නිවැරදිව පවත්වා ගෙන යාමට ගරු සභාපතිතුමා ඇතුළු ප්‍රදේශයේ දේශපාලන නායකත්වය මෙන් ම සෞඛ්‍ය අංශයේ දැඩි කැපවීම මත විශාල වැඩ කොටසක් කර ගෙන යන අතර, සෑම දෙනාගේ ම දායකත්වය මත රටේ සෞඛ්‍ය යහපත් අතට හරවා ගත හැකි වනු ඇතැයි ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රිතුමා සියළුම දෙනාට ස්තුතිය පුද කර සිටින ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම

- ප්‍රාදේශිය සභාව නගර සභාවක් කිරිමේ කටයුතු මේ වන විට කෘෂිකර්ම ගරු රාජ්‍ය අමාත්‍යතුමන් විසින් අවශ්‍ය සියළු කටයුතු සිදු කර ඇති බවත්, ඒ වගේ ම ගමකට ලක්ෂ 20 ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය තොරතුරු සියල්ල ලබාදී ඇති අතර, ලබන සතිය වගේ වන විට එහි වැඩ කටයුතු ආරම්භ කිරිමට නියමිත බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.9 ගරු උප සභාපති - ප්‍රදීප් විජේරත්න මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව විපක්ෂ නායකතුමා විසින් තෙනගල්ලන්ද, ඉත්තැකටුව, කහම්බාන ආශ්‍රිත ප්‍රදේශවල ඉඩම් බෙදා දීමක් සම්බන්ධව සාකච්ඡා කළ බැවින් මේ සම්බන්ධව වැරදි මතවාදයක් ගොඩ නැගෙමින් පවතින බැවින් එය නිවැරදි කිරීමක් කළ යුතු අතර, මෙම ප්‍රදේශවල පාරම්පරිකව හේන් වගා කළ ගොවියන්ගේ ඉඩම් ටික දැනට පවතින්නේ රක්ෂිත කලාපයක් තුළ වන අතර, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මෙම රක්ෂිතය ලකුණු කර ඒ ප්‍රදේශය තුළ හඳුනා ගත් ඉඩම්වලින් කොටසක් ප්‍රාදේශිය ලේකම්ට නිදහස් කර වගා කරන සියළු දෙනාට ඒ ඉඩම් බෙදා දීමට සූදානම් වන අතර, මේ සඳහා ගොවියන්ගේ කැමැත්තක් ද නොමැති බව ගරු උප සභාපති තුමා ප්‍රකාශ කර සිටි අතර,මෙම කාරණාව සම්බන්ධව ප්‍රචාරය වන වැරදි මත වාදය නිසාවෙන් නගරයේ මුදල් ඇති අයවළුන් ගොස් එම ප්‍රදේශවල ඉඩම් මිලදී ගැනීමට හෝ ලේඛනවලට නම් ඇතුළත් කර ගැනීම වැනි කටයුතුවල යෙදෙමින් පවතින අතර, මේ ඉඩම් බෙදා දීමක් සිදු වන්නනේ නම් එය අනිවාර්ය යෙන්ම හිමි විය යුත්තේ ඒ ආශ්‍රිතව සිටින ගොවියන්ට මිසක වෙනත් පුද්ගලයින්ට නොවන බැවින් මේ සඳහා විශේෂයෙන් ම මැදිහත් වී කටයුතු කරන බව ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම විශේෂයෙන් ම 2001 දී පමණ අවශේෂ කැලෑ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරීම සඳහා විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කර දිසාපති යටතේ පැවති ඉඩම් ටික එම දෙපාර්තමේන්තුවට පැවරූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් සියඹලාණ්ඩුව, කැබලිත්තවල ඉඩම් ද මෙම දෙපාර්තමේන්තුවට ම අයත් වන බවත් නැවත 2012 වර්ෂයේදී පමණ එසේ මෙම දෙපාර්තමේන්තුවට පවරා ගත් ඉඩම් ටික රක්ෂිත කලාප වශයෙන් නැවත ගැසට් කළ අතර, මෙම කාරණා දෙක ම සිදු වන්නේ මේ ප්‍ර දේශවල පාරම්පරිකව වගා කටයුතු කළ ගොවියන්ගේ ඉඩම් ටික ආවරණය වන පරිදි වන අතර, වන සංරක්ෂන දෙපාර්තමේන්තුව විසින් මෙම ඉඩම් රක්ෂිත කලාපයේ පවතින බැවින්, මේ ගොවියන් ඉවත් කර වන රෝපණ කලාපයක් වශයෙන් වෙන් කර ගැනීමට හඳුනා ගෙන සිටින අතර, මෙහිදී කැළෑ කපා එළිකොට පාරම්පරිකව මෙම ඉඩම්වල වගාවන් සිදු කර ගෙන ආ ගොවීන්ට මෙයින් ඉතා අසාධාරණයක් වී ඇති අතර, අතිගරු ජනාධිපතිතුමන් ගම සමග පිළිසඳරක් වැසටහන යටතේ මොනරාගල දිස්ත්‍රික්කයට පැමිණි අවස්ථාවේදී පාරම්පරිකව ගොවීන් වගා කළ ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා ගන්න එපා නඩු කියන්න එපා, තියෙන නඩුත් ඉවත් කර ගන්නා ලෙසට නියෝගයක් දී තිබුණ ද එම නියෝගය ද නොසලකා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් 2001, 2012 ගැසට් පත්‍ර සම්බන්ධ කර ගනිමින් මේ ගොවීන්ගේ ඉඩම් අත්පත් කර ගනීමට යාම සම්බන්ධව ගරු සභාපතිතුමන්, තමන් ඇතුළු කණ්ඩායමක් දීර්ඝ සාකච්ඡාවල් පැවැත්වූව ද අදාළ විෂය භාර ඇමතිතුමන් ද දැනුවත් කළ ද එතුමන්ගේවත් එකඟතාවයක් මේ ඉඩම් ටික ගොවියන්ට ලබා ගැනීමට ලැබී නොමැති අතර,

ඉදිරි වර්ෂා කන්නයේදී මේ ඉඩම් වගා කිරිමට මේ වන විට ගොවියන් විසින් අවශ්‍ය සියළුම කටයුතු සිදු කර ඇති බවට ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර, ඉදිරියේදී මෙය විශාල ගැටළුවක් වීමට ඉඩ පවතින නිසා දේශපාලනයකින් තොරව අපි සියළුම දෙනා මේ සඳහා මැදිහත් වී නැවත වතාවක් ඉහළ දේශපාලන අධිකාරිය, වග කිව යුතු සියළුම නිලධාරින්ටත් මේ බව දැනුම් දී මේ ගොවියන්ට සාධාරණයක් කරමු යන්න ප්‍රකාශ කරමින් ගරු උප සභාපතිතුමා සියළු දෙනාට ම ස්තුතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- මේ ඉඩම් සම්බන්ධ ගැටළුවේදී අදාළ නිලධාරින් සමග දීර්ඝ සාකච්ඡාවක් පැවැත් වුව ද මේ සඳහා විසඳුමක් ලබා ගැනීමට නොහැකි වූ අතර, මෙම ප්‍රශ්නයේදී පවා අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නන් සිටින අතර, නමුත් අතිගරු ජනාධිපතිතුමන් අහිංසක ජනතාව පදිංචි සහ වගා කරන ඉඩම්වලින් ඉවත් කිරිමට කිසිම විටක ඉඩ නොතබන අතර, මෙය සිදු වන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට උවමනා නිසා බවත්, නමුත් මේ සඳහා පැවති සාකච්ඡාවේදී ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්තුමන් විසින් DFO මහතා දැනට මේ ඉඩම් මනින එක නතර කර ඒ ජනතාවට දැනට වගා කටයුතු කර ගෙන යාමට අවස්ථාව සලසා දෙන ලෙස උපදෙස ලබා දුන් බැවින්, මේ අවස්ථාවේදී එම ජනතාවට සහනයක් ලැබෙයි යන්නත්, මෙම ප්‍රශ්නයට විසඳුමක් නොමැති වුවහොත් මේ සියළු ජනතාව ඉඩම් තුළදීම උද්ඝෝෂණයක් කිරිමට ඉඩ සලසා දෙමු බවටත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.10 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වයි.උපුල් මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව මුළු ලෝකය ම මෙම වසංගතයට මැරී මැරී මුහුණ දෙන කාලයකදී රාජ්‍ය සේවකයින් සතියකට දින 3 – 4 ක් පමණ කාර්යාලවල සේවය කරද්දී පඩි සහිතව ගුරුවරුන් නිවසට වී කාලය ගත කළ අතර, ඔවුන් විසින් අහිංසක දරුවන්ට On Line හරහා අධ්‍යාපනය ලබා දීමට කටයුතු කළ මොහොතක බොහෝ දරුවන් ඉතා අපහසුතා මධ්‍යයේ ඒ සඳහා සූදානම් වූ මොහොතක සෞඛ්‍ය අංශයත්, අධ්‍යාපන අංශයත් සිදු කරන උද්ඝෝෂන වැඩ පිළිවෙල දැඩි ලෙස හෙළා දකින බව ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම කොරෝනා එන්නත්කරණය මොනරාගල බල ප්‍රදේශය තුළ ඉතාමත් සාර්ථකව කර ගෙන යන අතර, එය අවුරුදු 60 ට වැඩි 30 ට වැඩි සියළුම දෙනා එන්නත් කිරිමට හැකිවීම පිළිබඳව ස්තුතිය පුද කර සිටින බවත්, ඒ වගේ ම 70% කට පමණ එන්නත්කරණය රට තුළ සිදු කර අවසන් වුවහොත් මේ වසංගතයෙන් රට මුදවා ගැනීමට හැකිවනු ඇතැයි ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කරන ලදී.

III. ඒ වගේම ප්‍රදේශයේ අතුරු මාර්ග කැපීම සම්බන්ධව මීට මාස ගණනක සිට තමන් විමසා සිටින අතර, වර්ෂාව පටන් ගැනීමට ඇත්තේ කෙටි කාලයක් බැවින් ප්‍රදේශයේ අතුරු මාර්ග කැපීම සඳහා මාර්ග කිහිපයක් පවතින අතර, මල ගෙදරට, මගුල් ගෙදරට, අතුරු මාර්ගවලට කිසිම දෙයක් කරන්නේ නෑ කියා ප්‍රදේශයේ ජනතාව විසින් මඩ ප්‍රහාර එල්ල කර ඇති බවට ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

එහිදී ඔය කියන ආකාරයේ කිසිම වැඩක් ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සභාව හරහා සිදු කර නොමැති බවට බොරු චෝදනා ප්‍රකාශ නොකරන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. මෙය බොරු චෝදනාවක් නොවන අතර, විශේෂයෙන් ම තම කොට්ඨාසයේ පවතින අඩුපාඩු සම්බන්ධව කොට්ඨාස භාර මන්ත්‍රීතුමා ලෙස ඒවා සොයා බැලීම තමාගේ වගකීමක් වන අතර, මේ වැසි සමයට පෙර යාමටවත් නොහැකි මේ අතුරු මාර්ග ටික කපා සකස් කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී සභාව ඝෝෂාකාරි වූ අතර, පැහැදිලිව සටහන් කර ගැනීමට අපහසු විය.

V. ඉන් අනතුරුව 1994 සිට භුක්ති වින්ද මේ වර්ෂයේ අප්‍රේල් මස දක්වා කුළී ගෙවන ලද කඩ කාමර ඔවුන්ගෙන් ඉවත් කර ඇති බවට මොනරාගල සමූපකාර නිලධාරින් පිරිසක් තම නිවසට ම විත් දැනුම් දුන් අතර, සමූපකාරය යනු දුප්පත් ජනතාවට සහනදායි මිලට අත්‍යාවශ්‍ය බඩු භාණ්ඩ ටික ගැනීමට ඇති එකම ස්ථානය වන අතර, ප්‍රාදේශිය සභාවට අයත් තාවකාලිකව ඉදිකරන ලද පොදු වෙළඳපොල කඩ කාමර 16 න් ඉතිරි කඩ කාමරය මෙම ව්‍යාපාරික ස්ථානයට භාර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරමින් සියළු දෙනාට ම ස්තුතිය පුද කර සිටින ලදී.

## 8.11 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ප්‍රදීප් විතානගේ මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව ගුරුවරුන්ගේ ගැටළුව සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරුණු අතර, මුට්ට කරගහන සේවකයාගේ සිට රටේ ජනාධිපතිතුමන් දක්වා සියළුම දෙනා බිහි කරන්නනේ ගුරුවරුන් වන අතර, නමුත් මේ සෑම අංශයක ම වැරදිකරුවන්, දූෂකයන්, වංචාකරුවන් සිටින අතර, ගුරුවරුන් මූලික කර ගනිමින් සිදුවූ මෙම අපහාස කිරිම සම්බන්ධව තමන් පෞද්ගලිකව ම විරෝධය පළ කර සිටින බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, මේ ආණ්ඩුව ගත් කළ අධ්‍යාපනය, ගුරුවරුන්ට, වෘත්තීය සමිතිවලට චෝදනා කර සිටිනවාට වඩා රටේ පවතින තත්ත්වය හමුවේ Data නැති Signal නැති දුප්පත් දරුවන්ට ඉගෙන ගැනීමට කිසිම ක්‍රම වේදයක් සකස් කර නොමැති බවත්, මෙවැනි ප්‍රශ්න තිබියදී කොතලාවල ආරක්ෂක අධ්‍යාපන පීඨය ගෙනත් රජය විසින් කරන්න යන වැඩපිළිවෙළ කුමක් ද යන්න ඉතාමත් ගැටළු සහගත බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම වෘත්තීය සමිති ගැන කතා කිරිමේදී මොන අඩුපාඩු පැමිණියත් වෘත්තීය සමිති යනු අයිතිවාසිකමක් වන අතර, ඕනෑම කෙනකුට එහි නායකයෙකු විය හැකි බවත්, නමුත් මේ ආණ්ඩුව මගින් දකින්නේ ම වෘත්තීය සමිතිවල අඩුපාඩු, පහුගිය ආණ්ඩුවෙන් සිදු වූ අඩු පාඩු වන අතර, නිවැරදි දෙයක් තවමත් සිදු නොවූ බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. මේ සභාවේ සභිකවරුන් විසින් කතා කරන සියළුම දේවල් කරුණු කාරණා සමස්ථයක් වශයෙන් ගෙන බැලීමේදී වහල් බවෙන් මිදෙන්න ඥානය පහළ වේවා කියා ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාට ම ස්තුතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- වෘත්තීය සමිති පැවැත්වීම වැරදියි කියා නොකියන අතර, රටේ මෙවැනි බරපතළ වසංගත තත්ත්වයක් මත මේවා ක්‍රියාත්මක කිරීම සුදුසු නැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලද අතර, කුමන බලවේගයක් ආවත් රජයක් වශයෙන් ආපස්සට නොයන බවත් ඒ වගේ ම මේ මොහොතේ දරුවන්ගේ අධ්‍යාපනය නැතිවන අයුරින් ගුරුවරුන් වැඩ කරනවා. ඒවා සුද්ධ කිරීමට කටයුතු නොකරන ලෙසත් එවැනි ගුරුවරුන්ට සාපයක් වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

- ඒ වගේ ම මෙය උත්තරීතර සභාවක් වන අතර, විනාඩි 30 කට වඩා ප්‍රමාදව මේ සභාවට සභිකවරුන් නොපැමිණීමට වග බලා ගන්නා ලෙසත්, එසේ පැමිණිය නොහැකි වන අය ලිඛිතව හේතු ඉදිරිපත් කර අවශ්‍ය දීමනාවල් ගබා ගන්නා ලෙසත්, ඒ වගේ ම සභාව තුලදී ප්‍ර දේශය තුළ දේවල් පමණක් කතා කිරීමට සභිකවරුන් වග බලා ගන්නා ලෙසත්, එකම දේ සියළු දෙනා කතා කිරීමට අවශ්‍ය නොවන බවත් සභා වාර්තාව නිවැරදිව පවත්වා ගෙන යාම අප කාගේත් වගකීමක් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

  සභිකවරුන්ගේ වෙනත් කරුණු තවදුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.6.30 ට පමණ අවසන් කරන ලදී.

2021.07.16 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

මෙම සභා වාර්තාව ........................................................................ වන දින පැවැති මහ සභාවේ.............................................................................................යෝජනාවෙන් සහ..................................................................................................ස්ථිරත්වයෙන් ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

4) මොනරාගල, මාගන්දනමුල්ල හි පිහිටි පරාක්‍රම මාවත ලිපිනයෙහි පදිංචි පවුල් 07 ක් පමණ භාවිතා කරන ඉතා අබලන්ව පැවති මාර්ගය ඊයේ දින ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් ගමන් කිරිමටවත් නොහැකි ලෙස දැඩි සෝදා පාළුවකට පත්ව ඇති බැවින් එම මාර්ගය කුට්ටි ගල් අතුරා ඉතා කඩිනමින් පිළිසකර කර දීම අත්‍යාවශ්‍ය බැවින්, ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පවුල් 07 ක පමණ ජීවත් වන ජනතාවක් මෙම මාර්ගය භාවිත කරන බැවින් කාර්මික නිලධාරි නිලධාරි මහතා යොදවා පරීක්ෂා කර බලා කුට්ටි ගල් අතුරා භාවිතා කළ හැකි පරිදි ඉතා කඩිනමින් සකස් කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

5) කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරිම සඳහා යන වියදම සලකා බලා දැනට කිලෝ ග්‍රෑම් 01 ක විකුණුම් මිල වන රු.15.00, රු.20.00 දක්වා ඉහළ නැංවීමටත්, තව ද එක් ගොවියෙකු සඳහා නිකුත් කළ හැකි උපරිම කිලෝ ප්‍රමාණය තීරණය කිරිම සඳහාත් ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කුඹුරු ඉඩම් හිමිකරුවන්ගේ ඉල්ලීම් පරිදි ඔවුන් එම ඉඩම් සඳහා අදාළ අක්කර බදු ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට ගෙවන්නේ නම් එම කුඹුරු ඉඩම් සඳහා ප්‍රාදේශීය සභාවේ ලේඛනවල සටහන් කර ඇති වරිපනම් බදු පිළිබඳ තොරතුරු සහ අදාළ බිල් කිරිම් නතර කිරිමටත්, එම දේපල සඳහා මෙතෙක් පවතින රු.407,841.68 ක අය කර ගැනීමට නොහැකි හිඟ මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යටත්ව ලේඛනවලින් කපා ඉවත් කිරිම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

- **ගරු සභාපතිතුමන් විසින් හදිසි යෝජනා ඉදිරිපත් කර සිටීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනා 01 ක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදී.

a) 2021 වර්ෂයට සභාව සතු සතිපොළ බදු ගත් බදුකරු විසින් ආරම්භක මාසයේ සිට ම රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් සතිපොළ පැවැත්වීම අඩාල වී ඇති අතර, පළමු සතිය තුළ සතිපොළ වසා තබන ලද අතර, දෙවන සතියේ සිට නැවත පොළ විවෘත කළ ද ගොවියන් නිෂ්පාදන රැගෙන ඒම වෙළඳුන්ගේ ප්‍රමාණය සහ සමස්ථ පාරිභෝගිකයන්ගේ පැමිණීම 50%කටත් වඩා අඩු බවත්, නගරයට පැමිණීමට බොහෝ දෙනෙක් අකැමත්තක් දක්වන බැවින් ගොවීන් තම නිෂ්පාදන තම නිවෙස් වෙතින් ම තොග වෙළඳුන්ට විකිණීමේ ක්‍රමවේදයක් ද පවතින නිසා ගිවිසුම්ගත මුදලට සතිපොළ බදු අය කර ගෙන යාම ඉතාමත් අපහසු බැවින්, ගිවිසුම් ප්‍රකාරව මාසිකව සභාවට ගෙවනු ලබන වාරික මුදලින් 50% ක සහන මුදලක් අඩු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මේ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයජීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමේ යම් සාධාරණත්වයක් පැවතිය ද මේ මොහොතේ මෙම ඉල්ලීම සඳහා මාසික වාරිකයෙන් 50% අඩු කිරීම සම්බන්ධව තීරණයක් ලබා දිය නොහැකි බවත්, ලබන සතියේ ද සතිපොළ පැවැත්වීම හා වෙළඳුන්ගේ පාරිභෝගිකයින්ගේ පැමිණීම සම්බන්ධව සොයා බලා ආදායම් පරීක්ෂක මගින් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සිදු කළ යුතු බවටත්, ඒ අනුව ඉදිරියේදී

තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.  සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.